# කාර්ය සාධන වාර්තාව - 2020

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන**
**රාජ්‍ය අමාත්‍යාංශය**

දෙවන මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල

# පිටු පෙළගැස්ම


| <u>පරිච්ඡේදය</u> | <u>පිටු අංකය</u> |
|---|---|
| පරිච්ඡේදය 1 | |
| 1.1 හැඳින්වීම | 2-3 |
| 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 4 |
| 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 5 |
| 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ | 6-7 |
| 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන් | 8-13 |
| 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සහ අරමුදල් | 14-17 |
| 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති | 18 |
| පරිච්ඡේදය 2- 2020 ප්‍රගතිය සහ 2021 ඉදිරි දැක්ම | 19-32 |
| පරිච්ඡේදය 3- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 33-40 |
| පරිච්ඡේදය 4 - කාර්ය සාධන දර්ශක | 41 |
| පරිච්ඡේදය 5 - තිරසර සංවර්ධන අරමුණු | 42 |
| පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ | 43-44 |
| පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව | 45-48 |

## 1.1 හැඳින්වීම

2019 නොවැම්බර් 16 වන දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව නව අමාත්‍යාංශ පිහිටුවීමත් සමග අංක 2158/41 හා 2020.01.17 දිනැති ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන,ජලසම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක විය.

ඉන් අනතුරුව 2020 අගෝස්තු 05 වන දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයත් සමග අමාත්‍යාංශ විෂයන් සංශෝධනය වූ අතර, 2020.08.09 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2187/27 දරණ ගැසට්පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස දැනට ක්‍රියාත්මක වේ. එමගින් මෙතෙක් ක්‍රියාත්මකව පැවති නිවාස හා ඉදිකිරීම් විෂය පථයට අමතරව ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන විෂය මෙම අමාත්‍යාංශයට ඇතුළත් විය. මීට අමතරව 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කැබිනට් අමාත්‍යාංශයක්ව පැවති පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය ද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ඇත.

තවද, දීර්ඝ කාලයක් මෙම අමාත්‍යාංශය යටතේ පැවති සභාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යන ආයතන මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වී ඇත.

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති රාමුව ක්‍රියත්මක කරමින් "සැමට සුව පහසු නිවසක් ලබා දීමේ ජාතික වැඩසටහන" ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන කාර්යභාරය මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ සඳහා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටළුවට පිළියම් සෙවීමේ "ඔබට ගෙයක් රටට හෙටක් නිවාස වැඩසටහන" 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

මෙම වැඩසටහන යටතේ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුලකට රු. 600,000 ක ආධාර මුදලක් සහ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් යුතුව නිවාස ඉදිකරනු ලැබේ. මෙම වැඩසටහන මගින් 2020 වසර අවසන් වන විට දිවයින පුරා නිවාස 9972 ඉදිකිරීම් ආරම්භ කළ අතර, ඉන් නිවාස 4772 ක් අවසන් කර ප්‍රතිලාභීන් පදිංචි කරවීමට හැකි විය.

2020 වසර වෙනුවෙන් අමාත්‍යාංශයට රු.මි. 279,171 ක සංවර්ධන ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර පැවති කොවිඩ් 19 අවදානම් තත්වය මධ්‍යයේ වුවද ඉන් රු.මි.134,338 වැය කර 48.12% ක් ප්‍රගතියක් ලගාකර ගැනීමට හැකි විය.

ඊට අමතරව, දැනට නිවාස ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඒවායේ වැඩ නිම කිරීම සඳහා මූල්‍ය ගැටළු පවතින පවුල් වලට මූල්‍ය ආධාර වැඩසටහන් සහ ණය ලබාදීමේ වැඩසටහන්ද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වේ.

මීට අමතරව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය සඳහා නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ වල මැදි ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලු වලට පිළියම් සෙවීම සඳහා දිවයිනේ සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිදි නිවාස ඒකක 100 බැගින් වන සියපත මහල් නිවාස සංකීර්ණ වැඩසටහන සඳහා මුල පිරීමට හැකි වූ අතර 2020 වර්ෂයේදී එහි මුල් අදියර ලෙස පළාත් 9 තුළ එක් මහල් නිවාසයක මූලික කටයුතු 2020 වර්ෂයේ දී ආරම්භ කිරීමට හැකි විය.

ඉදිකිරීම් අංශයේ පුහුණු ශ්‍රමික හිඟය සඳහා විසඳුම් සලසමින් පුහුණු වැඩසටහන් ගණනාවක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාවට නැංවීමට හැකි වූ අතර ඉදිකිරීම් කර්මාන්තයේදී ලබාගත යුතු විවිධ අනුමැතීන් සඳහා සරල ක්‍රමවේද හඳුන්වාදීමත්, ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් යුතු ඉදිකිරීම් ද්‍රව්‍ය වඩා සාධාරණ මිලකට ලබා ගතහැකි වන සේ වෙළඳපොල හැසිරවීමේ උපක්‍රම කෙරෙහි අමාත්‍යාංශයේ ප්‍රමුඛ අවධානය යොමු කළ වසරක් ලෙස මෙම වසර හැඳින්විය හැකිය

ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ සඳහන් වන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී රාජ්‍ය අංශයට අයත් ව්‍යවස්ථාපිත ආයතන මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී තම ස්වයං පැවැත්ම තහවුරු කර ගැනීම පසුගිය වර්ෂයේ දී සිදු කර ඇත. එනම් මෙම අමාත්‍යාංශය යටතේ පවතින දීර්ඝ කාලීනව පාඩු ලැබූ ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වැනි ආයතන නව ව්‍යාපාරික සැලසුම් ක්‍රියාවට නැංවීම තුළින් මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී තම ස්වයං පැවැත්ම තහවුරු කරගෙන ඇත.

උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පැවති ගැටුම් හේතුවෙන් අවතැන්වූවන් වෙනුවෙන් ක්‍රියාත්මක වූ නැවත පදිංචි කිරීමේ අංශයද මෙම අමාත්‍යාංශයට එක් වීම මගින් අමාත්‍යාංශයේ විෂයපථය තවදුරටත් පුළුල් විය.

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතට පත් කෙරිණි. නැවත පදිංචි කිරීමේ අංශය මගින් උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබයි.

අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන,

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ඕෂන් වීව් සංවර්ධන (පුද්.) සමාගම
- මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
- සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

## 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

### දැක්ම

" සැමට නිවාස හා තිරසර ඉදිකිරීම් "

### මෙහෙවර

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන යන අංශ වලට ජාතික නායකත්වය සැපයීම; ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයන් නියාමනය කිරීම; මූල්‍යකරණය, පහසුකම් සැපයීම සහ උපදේශනය තුලින් ජාතික නිවාස වැඩසටහනට සහාය වීම; මූල්‍ය, තාක්ෂණික, උපදේශන, යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය අංශයන්ගෙන් ඉදිකිරීම් කර්මාන්තයට සහාය වීම; සහ රාජ්‍ය ආයතන සඳහා ඉදිකිරීම් සේවා, අවකාශය හා ගොඩනැගිලි නඩත්තු සේවා සැපයීම මෙම අමාත්‍යංශයේ මෙහෙවර වේ .

### අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාළ ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

## 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

### නිවාස හා සංවර්ධන අංශය

1. නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, අණ පනත්, රෙගුලාසි, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අඩු ආදායම්ලාභීන්, මධ්‍ය ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම, නිවාස මූල්‍යාධාර හා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් හඳුනාගැනීම, අත්පත් කර ගැනීම, පවරා ගැනීම, බැහැර කිරීම හා ඔප්පු නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.

### තාක්ෂණ අංශය

1. ඉදිකිරීම් විෂයට අදාලව ප්‍රතිපත්ති නීතිරීති සම්පාදනය හා පසු විපරම් කිරීම.
2. ඉදිකිරීම් කර්මාන්තය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. අමාත්‍යාංශය යටතේ වන රජයේ දෙපාර්තමේන්තු, ඉදිකිරීම් සම්බන්ධ අධිකාරියන්හි කටයුතු නියාමනය හා මග පෙන්වීම.
4. රජයේ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු වල කාර්යයන් ඉටු කිරීම.


### ඉදිකිරීම් අංශය

1. අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන සම්බන්ධීකරණය සහ ප්‍රගතිය නියාමනය කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණිකමය නොවන ආයතන සඳහා ඉදිකිරීම් කටයුතු වලදී තාක්ෂණික මගපෙන්වීම් ලබාදීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රයන් අදාල විදේශීය වෘත්තිකයන් සහ පුහුණු වෘත්තිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම.

### අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය

1. අවතැන්වූ පවුල් සඳහා ග්‍රාමීය නිවාස ඉදි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබාදීම.
2. බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

# 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ




නියෝජ්‍ය අධ්‍යක්ෂ - නි. අ.
පරිපාලන නිලධාරි - ප.නි
තාක්ෂණ නිලධාරි- තා.නි

සහකාර ලේකම් - ස.ලේ
තොරතුරු තාක්ෂණ නිලධාරි -තො.තා.නි
රියදුරු -රි


සහකාර අධ්‍යක්ෂ - ස.අ
භාෂා පරිවර්තක නිලධාරි - භා.පරි.
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස

ගණකාධිකාරි -ගණ
සංවර්ධන නිලධාරි - සං.

නීති නිලධාරි - නි.නි
රාජ්‍ය කළමනාකරණ නිලධාරි - රා.කළ.නි

ප්‍රමාණ සමීක්ෂක - ප්‍ර.ස

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ




ගණකාධිකාරී -ගණ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නි. අ.
සහකාර ලේකම් - ස.ලේ
උපාධිධාරී අභ්‍යාසලාභී - උ.අ

සහකාර අධ්‍යක්ෂ - ස.අ
ඡායාරූප ශිල්පී - ඡා.ශි
නීති නිලධාරී - නි.නි
කළමනාකරණ සහකාර (දිස්ත්‍රික්)- ක.ස(දි)

පරිපාලන නිලධාරී - ප.නි
භාෂා පරිවර්තක නිලධාරී - භා.පරි.
තොරතුරු තාක්ෂණ නිලධාරී -තො.තා.නි

කැමරා ක්‍රියාකරු - කැ.ක්‍රි
සංවර්ධන නිලධාරී - සං.නි
තාක්ෂණ නිලධාරී- තා.නි

වීඩියෝ ඡායාරූප ශිල්පී - ඡා.ශි
කළමනාකරණ සේවා නිලධාරී- ක.සේ.නි
සහකාර ඡාරූප ශිල්පී - ස.ඡා.ශි

රියදුරු -රි
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස

## 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන්

### 1.5.1 පාලන අංශය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනයට අදාල සියලුම කාර්යයන් හා මානව සම්පත් කළමනාකරණය ප්‍රධාන කර්තව්‍යය වන අතර ඒ සඳහා අවශ්‍ය වන පරිසරය සකස් කිරීම භෞතික සම්පත් ඵලදායී කළමනාකරණය. එසේම අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල සියළුම ආයතනික කටයුතු හා මානව සම්පත් කළමනාකරණය සහ එම කටයුතු සඳහා සහායවීම පාලන අංශයෙන් සිදුකරනු ලබයි.

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු හා සියලුම නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
2. අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
3. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
4. අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණයට අදාලව මු.රෙ.135 යටතේ පාලන අංශයේ නිලධාරීන් වෙත පවරන ලද බලතල ප්‍රකාරව කටයුතු කිරීම.
5. පාලන අංශයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම.
6. පාර්ලිමේන්තුව සම්බන්ධ අදාල කටයුතු සම්බන්ධීකරණය.
7. මානව සම්පත් සංවර්ධනයට අදාල දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු කිරීම.
8. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා පිළිබඳ සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
9. රැස්වීම් හා විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම.
10. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණයට අදාල ක්‍රමවේද වැඩිදියුණු කිරීම සම්බන්ධීකරණ කටයුතු කිරීම.
11. ස්ථාවර වත්කම් කළමනාකරණය හා නඩත්තු කටයුතු කිරීම.

### 1.5.2 සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම් කළ පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීම අංශයේ ප්‍රධාන කාර්යය භාරය වේ. නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීමද ඊට අයත්ය. තවද, නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් පසු විපරම් කිරීම හා ඇගයීම් කිරීමත් සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අදාලව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.
2. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වල ව්‍යාපෘති යෝජනා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
3. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
4. ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.

5. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මාසිකව හා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇගයීම.
6. අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාල අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම.
7. අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාව හා කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීම.
8. ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම හා පසුවිපරම් කිරීම.
9. විදේශාධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

## 1.5.3 නිවාස හා සංවර්ධන අංශය

### 1.5.3.1 නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලගා කර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟපෙන්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්**

**1. ප්‍රතිපත්ති සම්පාදනය**

- නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
- නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම.
- නිවාස ක්ෂේත්‍රයට අදාල පනත් සංශෝධනය හා රෙගුලාසි සම්පාදනය.
- නිවාස ක්ෂේත්‍රයට අදාල වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.

**2. නිවාස සංවර්ධනය**

- අඩු ආදායම්ලාභී ජනතාව සඳහා දීප ව්‍යාප්තව " ඔබට ගෙයක්-රටට හෙටක් " නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මැදි ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ මහල් නිවාස ඉදිකිරීමේ " සියපත" නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පදිංචියට සුදුසු නිවසක් නොමැති ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ මා පිය පවුල් වෙත නිවාස ලබා දීමේ " මිහිදු නිවහන" වැඩසටහන.
- සහභාගිත්ව ක්‍රමවේදය නිවාස ණය / ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත සංවර්ධනය කිරීම සම්බන්ධ කටයුතු.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමඟ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කටයුතු.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහජනතාවගෙන් ඉදිරිපත් වන නිවාස ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

**3. වෙනත් රාජකාරී**

- ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම.
- එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සමග සිදුකරන අනෙකුත් කටයුතු.

### 1.5.3.2 ඉඩම් අංශය

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8(1) වගන්තිය අනුව අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක්, මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් අන්සතු කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතුවේ. ඒ යටතේ, මුදල් ගෙවා අවසන් කළ නිවාස/ ඉඩම්ලාභීන්ට ඔප්පු නිකුත් කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

විසින් සකස් කර එවනු ලබන ලේඛන වලට අනුමැතිය ලබාගෙන නැවත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීම සිදු කෙරේ. එමෙන්ම නිවාස වැඩසටහන් සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම, අදාල ආයතන සමග සම්බන්ධීකරණය සිදුකරමින් ඉඩම් අත්පත් කරගැනීම් සහ බැහැර කිරීමේ කාර්යයන් වේගවත් කිරීම, ඉඩම් විෂය සම්බන්ධව ඉදිරිපත් වන ගැටළු සහ ඉල්ලීම් සම්බන්ධ කටයුතු කිරීම මෙම අංශය මගින් සිදුකරයි.

**ඉඩම් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම /පවරා ගැනීම සම්බන්ධ කටයුතු.
2. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.
3. ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට පවරා දීම.

**මැදි ආදායම් ව්‍යාපෘති ඒකකය**

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් මධ්‍ය ආදායම්ලාභීන් වෙනුවෙන් දැරිය හැකි මිලකට නිවාස ලබා දීමේ අරමුණින් නිවාස ඉදිකිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මේ සඳහා අවශ්‍ය ඉඩම් රජය මගින් ලබාදෙනු ලබන අතර යටිතල පහසුකම් නිවාස ව්‍යාපෘතිය දක්වා ලබා දීම එම සේවා සපයන රේඛීය ආයතන හා අමාත්‍යාංශ මගින් සිදු කරයි. මෙම නිවාස වැඩසටහන තුල නිවාස ඉදිකිරීම හා අලෙවිය අදාල නිවාස ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආයෝජනය සිදු කරන ආයෝජකයාගේ කාර්යභාරය වනු ඇත.

### 1.5.3.3 ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති යම් කාර්යයන් ද ඉටු කරයි.

**ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම.
2. රජයට පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
3. පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති කොටස් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු නිරාකරණය කිරීම.

## 1.5.4 තාක්ෂණ අංශය

### 1.5.4.1 තාක්ෂණ අංශය

අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව යන ආයතනවල කටයුතු සඳහා සහයෝගය සම්බන්ධීකරණය හා තාක්ෂණික මග පෙන්වීම සිදු කරනු ලැබේ. ඒ අනුව, සියළුම ආයතන සම්බන්ධයෙන් වෙන වෙනම පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් අමාත්‍යාංශය තුළ සිදු කෙරේ.

මූලික වශයෙන් මෙම අමාත්‍යාංශය ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධි විධාන සැලැස්වීමට, ගුණාත්මක හා පරිසර හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් බිහි කිරීමට ඇති ආයතන මෙහෙයවීම සිදු කෙරේ. ඒ සඳහා මූලිකවම මැදිහත් වන්නේ තාක්ෂණ අංශයයි.

**තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පනත් කෙටුම්පත් සහ පනත් සම්බන්ධ කටයුතු කිරීම.
3. තාක්ෂණ අංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තය නියාමනය සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
4. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සුදානම් කිරීම සඳහා කටයුතු කිරීම.
5. වෘත්තියවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

### 1.5.4.2 ඉංජිනේරු සේවා අංශය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සාධාරණ හා දැරිය හැකි මිල ගණන් නියම කිරීම තුළින් සමස්ත ඉදිකිරීම් කර්මාන්තයේ, මුළු ඉදිකිරීම් පිරිවැය පාලනය කිරීමත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විනිවිද භාවයකින් යුතුව සාධාරණ මිල ගණන් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට සහාය වීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

**ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. රජයේ ආයතන වල ඉදිකිරීම් සම්බන්ධ ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතිය ලබාදීම.
2. කොන්ත්‍රාත් විචලනයන් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම.
3. අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටු සම්බන්ධව කටයුතු කිරීම.
4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම.
5. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල මිල ගණන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගෙන යාම.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

## 1.5.5 ඉදිකිරීම් අංශය

2019.05.29 වන දින අතිරේක ලේකම්වරයකු පත් කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් අංශය ස්ථාපිත විය.

මූලික වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මධ්‍යම ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම, අතිරේක ලේකම් ඉදිකිරීම් අංශය මෙම අමාත්‍යාංශය තුල ස්ථාපිත කිරීමෙන් පසු පැවරුණු ප්‍රධාන කාර්ය භාරය වේ.

**ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. අදාල ආයතන වල ප්‍රගතිය සමාලෝචනය.
2. අදාල ආයතනවලට ලැබිය යුතු හිග මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අධීක්ෂණය කිරීම.
4. උපදේශන සේවා සැපයීම.
5. අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
6. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධීකරණය කිරීම.
7. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
8. දේශීය නිපුණතාවයක් ඇති පුද්ගලයින්ට අගතියක් නොවන පරිදි විදේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත පුද්ගලයින් සඳහා විසා බලපත්‍රයක් ලබා ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.

## 1.5.6 මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
3. මූල්‍ය කළමනාකරණ, මූල්‍ය සැලසුම්, අයවැයකරණය, වත්කම් කළමනාකරණය හා මිලදී ගැනීම්, කළමනාකරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා යටතේ ඇති ආයතන සඳහා උපදෙස් හා මගපෙන්වීම ලබාදීම.

4. මුදල් අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගත හැකි ආකාරයට මූල්‍ය සම්පත් භාණ්ඩාගාරයෙන් ලබාගෙන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අතර බෙදා හැරීම.
5. අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කිරීම පෙරදැරිකොට එම ආයතන සමග සාමූහිකව වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම හා වර්ෂය පුරා අයවැය පාලන කටයුතු කිරීම.
6. වාර්ෂික විසර්ජන පනත් මගින් අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට වෙන් කරන මුදල් වියදම් කිරීමේදී නියමිත පරිදි වාර්තා කිරීම හා මාසිකව, වාර්ෂිකව මූල්‍ය වාර්තා අදාල ආයතන වලට ඉදිරිපත් කිරීම.
7. රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් එම අංශ මගින් යෝජනා කරන අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.
8. අමාත්‍යාංශයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කිරීම.

## 1.5.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති / අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කර ගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගී වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මග පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් සහායවීම.

### අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම.
2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.
3. විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවම කර ගැනීමට සහාය වීම.
4. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම.

## 1.5.8 නැවත පදිංචි කිරීමේ අංශය

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතට පත් කෙරිණි. නැවත පදිංචි කිරීමේ අංශය මඟින් උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව මෙම අංශය මගින් මේ වන විට උතුරු පළාතේ පවුල් 176,143 කට අයත් පුද්ගලයින් 565,335 ක්ද නැගෙනහිර පළාතේ පවුල් 91,310 අයත් පුද්ගලයින් 338,306 ක් මුල් ගම් බිම් වල හෝ විකල්ප ස්ථාන වල නැවත පදිංචි කිරීම සිදු කර ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

මෙයට අමතරව පවුල් 4,182 අයත් පුද්ගලයින් 11,551 නැවත පදිංචි කිරීමට නියමිතව ඇත. මෙයට අමතරව ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් ව ඉන්දියාව බලා පිටත් වූ පවුල් අතුරෙන් නැවත ලංකාවට පැමිණි පවුල් ඔවුන්ගේ මුල් ගම්බිම් වල නැවත පදිංචි කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. එහිදී මොවුන්ට අවශ්‍ය නිවාස සහ අනෙකුත් මූලික යටිතල පහසුකම් ලබා දීම ද සිදු කරනු ලබයි.

තවද මෙම අංශය මඟින් උතුරු හා නැගෙනහිර පළාත් වල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාව හා රාජ්‍ය නොවන සංවිධාන සමග (මයින් ඇඩ්වසරි ගෲප් ආයතනය, හලෝ ට්‍රස්ට් ආයතනය, ඩෙල්වෝන් ඇසිස්ටන්ස් ෆෝ ෂෝෂල් හාර්මනි ආයතනය, ස්කවිතා හියුමනිටේරියන් ඇසිස්ටන්ස් ඇන්ඩ්

රිලයිෆ් ප්‍රොජෙක්ට් ආයතනය) එක්ව සිදුකොට ඉඩම් නැවත ජනතා අයිතියට පත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරනු ලබයි.

මේ වන විට වර්ග කි.මී. 1302.24 ප්‍රමාණයක් බිම් වෙඩි ඉවත් කොට නැවත පදිංචි කිරීම් හා සංවර්ධන කටයුතු සඳහා නිදහස් කොට ඇත. මෙයට අමතරව කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වල වර්ග කි.මී. 14.15 ක ප්‍රමාණයක බිම් වෙඩි ඉවත් කිරීමට ඉතිරිව ඇත.

## නැවත පදිංචි කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. උතුරු නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම.

2. ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි සුභසාධන මධ්‍යස්ථාන වල වාසය කරන ඉඩම් අහිමි පවුල් සඳහා රාජ්‍ය ආධාර මත ඉඩම් මිල දී ගෙන ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබා දීම.

- පානීය ජල පහසුකම් ලබා දීම.
- ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබා දීම.
- හානියට පත් නිවාස අළුත්වැඩියා කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් ලබා දීම.
- අවතැන් වූ පවුල් වාසය කරන ප්‍රදේශ වල අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම.
- හානියට පත් පාසල් ගොඩනැගිලි හා පෙර පාසල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම.

4. බිම් වෙඩි හා පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මෙහෙයවමින් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු හා සංවර්ධන කටයුතු සඳහා ඉඩම් නිදහස් කිරීම.

5. නැවත පදිංචි කිරීමේ කටයුතු වලට පහසුකම් සපයන දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම.

6. අවතැන් වූ ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා ජීවනෝපාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන හා ව්‍යාපෘති ඒකක

## 1.6.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත මගින් ස්ථාපිත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් බවට පත්කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජීවත් වන සෑම පුරවැසියකුම සුවපහසු නිවසක සතුටින් ජීවත්වීම තහවුරු කිරීම සඳහා පහසුකම් සැලසීම,උනන්දු කරලීම හා සම්බන්ධීකරණය කිරීම සිදුකරනු ලබයි.අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතාවය ඉටුකිරීමට " ඔබට ගෙයක් රටට හෙටක් " වැඩසටහන ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇති අතර මධ්‍ය ආදායම්ලාභීන් සඳහා දැරිය හැකි මිලකට නිවසක් ලබාදීම සඳහ සියපත/සපිරි මහල් නිවාස වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. 2164 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයක් සහිත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වර්තමානයේ 1655 ක් වූ ස්ථිර කාර්ය මණ්ඩලයක් හා තාවකාලික හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ඇතුළත්ව සත්‍ය කාර්ය මණ්ඩලය 1970ක් සමගින් එහි කටයුතු කොළඹ-02 පිහිටි ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි ස්ථාපිත දිස්ත්‍රික් කාර්යාල 25ක් හා කොළඹ නගර කාර්යාල 2කට අමතරව තවත් උප කාර්යාල 8ක් මගින් එහි සේවාවන් ජනතාවට වඩාත් පහසුවෙන් ලබා ගත හැකි වන පරිදි විමධ්‍යගත කර ඇත.

## 1.6.2 ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම

ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරියෙහි කොටස් ප්‍රාග්ධනයෙන් සමන්විතව 1994 වර්ෂයේ ජුලි 13 වන දින 1982/17 දරණ පනතින් සංස්ථාපනය කරන ලදුව පසුව 2007/7 දරන නව සමාගම් පනත යටතේ ලි.ප.අංක - පීවී 17667 මගින් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

රාජ්‍ය සමාගමක් ලෙස දේපල සංවර්ධනය හා දේපල කළමණාකරනයෙහි විශිෂ්ඨත්වයට පත්, රාජ්‍ය ආයතනයක් ලෙස විශ්වාසනීයවත්, පුද්ගලික සමාගමක් ලෙස කාර්යක්ෂමතාවය පදනම් කොටගෙන පාරිභෝගිකයා වෙත කඩිනම්, තත්වයෙන් උසස්, ප්‍රමිතියානුකූල සේවාවක් සැපයීම හා පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයට සරිලන පරිදි තනි නිවාස මෙන්ම නිවාස ව්‍යාපෘති ඉදිකොට වෙළෙඳපල තරගකාරීත්වය මත පදනම් වූ හා සාධාරණ මිලකට අලෙවි කිරීම සිදු කිරීම.

## 1.6.3 මධ්‍ය ආදායම් හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකය

2016 වර්ෂයේදී හඳුන්වාදෙන ලද මෙම වැඩසටහන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුලක් සඳහා සියළු පහසුකම් වලින් සපිරි නිවසක් උරුමකර දීමේ අරමුණින් යුතුව නිවසක් සතු කරගැනීමට මාර්ගයක් නොමැති හා නිවාස නොමැති රාජ්‍ය/පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුල් වලට පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය කිරීම මගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම මෙන්ම ආර්ථික සමෘද්ධිය ලගාකරදීම මෙමගින් සිදු කරනු ලබයි.

## 1.6.4 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1849 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලෙසින් ආරම්භ වු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී " ඒ " කාණ්ඩයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබු අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් අනතුරුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එකම අධිකාරි ආයතනය සහ උපදේශක ආයතනය ලෙස සළකනු ලැබේ.

ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 07 ක් මගින් දිවයින පුරා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මගින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් වස් විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබේ.

මෙම ආයතනය ISO 9001/2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.

## 1.6.5 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 1849 වර්ෂයේ එවකට පැවති බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විසින් කොළඹ ගෑස්පහ හංදියේදී ආරම්භ කර ඇත. 1928 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික වැඩපල වශයෙන් දැනට පවතින කොලොන්නාව භූමියේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ සියළුම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ස්ථාපිත කරන ලදි. 1971 වර්ෂයේදී " ඒ " ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පත් කර ඇත.

දැනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ජල පාලන දිය දොරටු සාදා සැපයීම, සවි කිරීම හා නඩත්තුව, තැපැල් දෙපාර්තමේන්තුවේ දින මුද්‍රා හා දින කැට සාදා සැපයීම, පොලිස් දෙපාර්තමේන්තුවේ අංක තහඩු සහ සාජන් පටි සෑදීම, දැවමය ගෘහ භාණ්ඩ සාදා

සැපයීම, ජල සම්පාදන මණ්ඩලයේ ජලය පිරිපහදු ටැංකි සෑදීම, රාජ්‍ය උත්සව සඳහා පිලිගැනීමේ පීඨිකා සවි කිරීම, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යකඩ පාලම් සාදා සවිකිරීම, ආයතන වල කාමර වෙන් කිරීම (Aluminium Partition) සහ නාම පුවරු සාදා සවි කිරීම, රාජ්‍ය ආයතනවල වාහන සේවා හා නඩත්තු කිරීම, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත චීනවට්ටි, තිරිංග පලු ඇතුළු චීනවට්ටියෙන් නිම කරන ලද භාණ්ඩ සාදා සැපයීම, දැවමයෙන් හා යකඩයෙන් නිම කරන ලද රෝහල් උපකරණ සාදා සැපයීම, බොයිලේරු සහ ගෑස්නල පද්ධති නඩත්තු කටයුතු, තාක්ෂණික ආයතන, විශ්ව විද්‍යාල සිසුන් සහ ඉංජිනේරුවන්හට ප්‍රායෝගික පුහුණුව ලබා දීම ආදී කටයුතු සිදුකරනු ලබයි.

අප ආයතනය ISO 9001 /2015 තත්ත්ව සහතිකය ලබාගෙන ඇත.

### 1.6.6 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් සඳහා අධිකාරිය කටයුතු කරනු ලැබේ.

### 1.6.7 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයකි.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශක සේවා ලබාදීම, ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය, පෙරසවි/පෙරැදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබාදීම මෙන්ම පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.

2009 වසරේ සිට ISO 9001/2000 තත්ත්ව සහතිකයෙන් හා ISO 14001/2004 පරිසර කළමනාකරණ සහතිකයෙන්ද පිදුම් ලබා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

### 1.6.8 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

රාජ්‍ය ආයතන වලට යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 වසරේ දී පිහිටුවන ලදි. 2011 වසරේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශය ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඒ යටතට ගනු ලැබූ අතර 2016 වසරේ

ජනවාරි මාසයේ දී නැවත වරක් අමාත්‍යමණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේම කළමනාකරණ මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ.

වනජීවී, සත්වෝද්‍යාන, වාරිමාර්ග, වෙරළ සංරක්ෂණ සහ දුම්රිය ආදී දෙපාර්තමේන්තු විසින් ප්‍රදානය කරනු ලබන විශේෂිත කොන්ත්‍රාත් මගින් මෙම ආයතනය ඉදිරියට යමින් සිටියි. මුද්‍රණ වෘත්තිකයින්, පුහුණු සේවකයන් සහ කම්කරු මට්ටමේ සේවකයන්ගෙන් සැදුම්ලත් කාර්යය මණ්ඩලයකින් සමන්විතය. තවද ආයතනය බර යන්ත්‍රෝපකරණ ඇණියක් සහ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා සේවය සපයන ඩිපෝ පද්ධතියකින් මෙන්ම දිවයිනේ සෑම පළාතකම පිහිටි සියළු පහසුකම් වලින් සමන්විත යාන්ත්‍රික වැඩහල් වලින් යුක්තය.

### 1.6.9 සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා සමාගම

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කරන ලදි. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ 100% රජය සතු සී/ස වගකීම් සහිත සමාගමක් බවට මෙම සංස්ථාව පත්කරන ලදි. 2007 වර්ෂයේදී සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් විය. නැවත 2010 වර්ෂයේ මාර්තු මාසයේදී 2007 සමාගම් පනතේ අංක 07 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

බාහිර ශාඛා 16 කින් සමන්විතව දීප ව්‍යාප්තව ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ඉහල ප්‍රමිතියකින් හා මිල නියාමනයකින් යුක්තව පාරිභෝගිකයන්ට සැපයීමට සහ එකම වහලක් යට සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ විවිධ සැපයුම්කරුවන් අතරින් තෝරාගෙන පාරිභෝගිකයන්ට මිලදී ගැනීමට අවකාශයක් ලබා දී තිබීම මෙමගින් සිදු කරනු ලැබේ.

## 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති 5 ක් මෙම අමාත්‍යාංශය යටතේ පවතී.

| **ව්‍යාපෘතිය** | **මුල්‍ය වටිනාකම** | **ව්‍යාපෘති කාලසීමාව** | **ව්‍යාපෘති අරමුණු** |
|---|---|---|---|
| පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතිය (විලච්චිය) | රු.මි.300 | 2018-2019 ( කොන්ත්‍රාත් සමාගමේ ගැටලුවක් හේතුවෙන් ඉදිකිරීම් තාවකාලිකව නතර වී ඇත, කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතියි) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම ග්‍රාම නිලධාරි වසමේ දිළිඳු පවුල් 153 සඳහා නිවාස සැපයීම ඇතුළු මූලික සමාජ යටිතල පහසුකම් සැපයීම |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය 1 | රු.මි.300 | 2017-2020 (කාල සීමාව දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| දීප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2017-2020 (කාල සීමාව දීර්ඝ කර ඇත) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය 11 | රු.මි.300 | 2018-2021 | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2018-2021 | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |

# පරිච්ඡේදය 2

## 2020 ප්‍රගතිය සහ 2021 ඉදිරි දැක්ම (අංශ අනුව)

### 2.1 - පාලන අංශය

### 2020 ප්‍රගතිය

❖ **අංක 2187 / 27 හා 2020 .08. 09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස ස්ථාපිත කරන ලදී.**

ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතට අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ අංශය ද ඒකාබද්ධ විය. එම සියළු කරුණු සලකා මෙම අමාත්‍යාංශය සඳහා සංශෝධිත නව කාර්ය මණ්ඩලයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල අතර 2020.09.04 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

❖ **2020 අගෝස්තු මස 14 වන දින පත් වූ මෙම අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යාවරයාගේ එම පෞද්ගලික කාර්ය මණ්ඩලය පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.**

❖ **පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය**

මෙම අමාත්‍යාංශයට අදාල සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු කටයුතු එනම් වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම, සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, වැඩ බැලීම සඳහා පත් කිරීම හා රාජ්‍ය සේවයේ විශ්‍රාම ගැන්වීම යන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

❖ **මූල්‍යය කළමනාකරණය**

අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් රෙගුලාසි 135 යටතේ පවරන ලද බලතල ප්‍රකාරව පාලන අංශය වෙත ලැබෙන සියළුම වියදම් ගෙවීම් වවුචර්, ආපදාණය/විශේෂ අත්තිකාරම් ඉල්ලීම් අදාල ගෙවීම්වල නිවැරදිතාවය පරික්ෂා කර බලා අනුමැතිය හා නිර්දේශ ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදුකර ඇත.

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ**

2020 වර්ෂයේ අනෙකුත් අංශවලින් ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 20ක් හා පාලන අංශයට අදාලව සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 09ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා සම්බන්ධීකරණය සිදුකල අතර අමාත්‍යාංශය වෙත ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ 75ක් අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් වෙත හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන ප්‍රධානීන් වෙත යොමුකර ඇත.

පාර්ලිමේන්තු ප්‍රශ්න 17ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර අදාල පිළිතුරු පාර්ලිමේන්තුව වෙත සහ විමසනු ලැබූ ගරු මන්ත්‍රීවරුන් වෙත යොමුකර ඇත.

❖ **අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කාර්ය සාධන වාර්තා**

පසුගිය වර්ෂවල ඉදිරිපත් කිරීමට ප්‍රමාදවී තිබුණු පහත සඳහන් ආයතනවල වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අදාලව පහත සඳහන් පරිදි කටයුතු සිදුකර ඇත.

1. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
   - 2016, 2017,2018, 2019 වර්ෂවල කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
   - 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
   - 2019 වර්ෂයේ ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.
3. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
   - 2016 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත යොමුකර ඇත.
   - 2017 වර්ෂයේ වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත්කර ඇත.
   - 2018 වර්ෂයේ වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩල සංදේශ අනුමැතිය ලැබී ඇත. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

4. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

- 2016 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත යොමුකර ඇත.
- 2017 වර්ෂයේ වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලයට යොමුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

5. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

- 2016 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත යොමුකිරීමට කටයුතු කර ඇත.

6. මෙම අමාත්‍යාංශය යටතේ පෙර පැවති ආයතනයන් වන සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය හා රාජ්‍ය සංවර්ධන හා නිර්මාන නීතිගත සංස්ථාව

- සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය -
  2016 වර්ෂයේ වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාල අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- රාජ්‍ය සංවර්ධන හා නිර්මාන නීතිගත සංස්ථාව -
  2016, 2017, 2018 වර්ෂවල වාර්ෂික වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන අදාල අමාත්‍යාංය වෙත යොමු කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ආයතනයන්හි තවදුරටත් ප්‍රමාදවී පවතින වාර්තා හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන ලෙස දැනුම් දී ඇත.

7. ස්ථාවර වත්කම් කලමනාකරණය

නිවාස සහ ඉදිකිරීම් අංශයේ වාහන 37ක් නඩත්තු කටයුතු සාර්ථකව සිදුකර ඇති අතර වාහන අලුත්වැඩියාව, සේවාකිරීම්, අනෙකුත් සේවා, ටයර් හා බැටරි සවිකිරීම් හා රක්ෂණය කිරීම් සඳහා රු. 5,209,431.06 මුදලක් දරා ඇත.

අමාත්‍යාංශයේ වායු සමීකරණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර,පරිගනක, මුද්‍රණ හා ෆැක්ස් යන්ත්‍ර , ඇගිලි සලකුණු යන්ත්‍ර, මෘදුකාංග, අභ්‍යන්තර දුරකතන පද්ධති, ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහාත් 2020 වර්ෂයේදී රු.1,551,185.31 ක මුදලක් වැය කර ඇත.

8. පුහුණු වැඩ සටහන් පැවැත්වීම

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විෂය අවබෝධය තවදුරටත් පුළුල් කිරීම හා ආකල්ප සංවර්ධනය උදෙසා නිලධාරීන් 51 දෙනෙකු සඳහා කළමනාකරණය පිළිබඳ වැඩසටහන් පවත්වන ලදි. ඊට අමතරව විවිධ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් පවත්වනු ලැබූ විෂයානුබද්ධ පුහුණු වැඩ සටහන් සඳහා මාණ්ඩලික නොවන නිලධාරීන් දෙදෙනෙකු සහභාගි කරවා ඇත. සියළුම නිලධාරීන්ට පැය 12ක පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුන ද පැවති කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් කටයුතු කිරීමට අපහසු වූ නමුත් එවන් වාතාවරණයක් පැවතිය ද අමාත්‍යාංශය තුල පුහුණු සැසි 5ක් පවත්වන ලදි.

9. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කලමනාකරණය

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කලමනාකරණය සඳහා පහත පරිදි සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

- අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන සඳහා සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- නිවාස සංවර්ධන අධිකාරිය සඳහා නව බඳවාගැනීම් පරිපාටියක් කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
- නිවාස සංවර්ධන අධිකාරියේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාදී ඇති අතර ඒ සඳහා උපදෙස් හා සහාය ලබාදී ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා අවශ්‍ය අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශයේ අනුමැතිය ලබාදී ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ බඳවා ගැනීම් පරිපාටියේ පැවති ගැටළුකාරී තත්ත්වයන් නිරවුල් කර ගැනීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- අ.ම.ප./19/2721/122/056 iii දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් වූ තීරණය 2019 වර්ෂයේදී ක්‍රියාත්මක නොවූ අතර 2020 වර්ෂයේ අප්‍රේල් මස සිට මෙම තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරඇත. ඒ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින් 113 ක් ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමට කටයුතු සිදුකර ඇත.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පැවති පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය දී ඇත.

- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවෙහි සාමාජිකයන් පත්කිරීමට කටයුතු කර ඇත.
- රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවේ සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පරිපාටි 05 ක් රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.
- සීමා සහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සඳහා ස්ථිර කාර්යමණ්ඩලයක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එය අනුමත වන තෙක් කොන්ත්‍රාත් පදනම මත අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාල අනුමැතිය කලමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

10. මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

2020 වර්ෂයට අදාලව ජනාධිපති කාර්යාලයෙන් හා අගමැති කාර්යාලයෙන් මෙම අමාත්‍යාංශයේ පාලන අංශයට මහජන ඉල්ලීම් 1979 ක් ලැබී ඇති අතර දේශපාලන පලිගැනීම්වල අදාල ඉල්ලීම් 12 ක් ලැබී ඇත. ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන අතර එවැනි මහජන ඉල්ලීම් 1917 ක් නිවාස අංශය වෙත යොමු කර ඇත. එසේම සේවකයින්ගේ ආයතනික ගැටළු සහ වෘත්තීය ගැටළු සෘජුවම අදාල ආයතනය වෙත යොමු කරන අතර ලැබෙන පිළිතුර අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉහත මහජන ඉල්ලීම් සඳහා නොපමාව කටයුතු කරනු ලබන අතර ආයතනික හා වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට කටයුතු කරනු ලබයි.

11. රැස්වීම්

මාණ්ඩලික නිලධාරී රැස්වීම් සහ විශේෂ රැස්වීම් ලෙස 2020 වර්ෂය මුළුල්ලේ රැස්වීම් වාර 10 ක් පවත්වා ඇති අතර එහිදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමට සියළුම අංශ ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.

12. විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම
    - 2020.01.01 නව වසරේ රාජකාරී ආරම්භ කිරීම
    - නව රාජ්‍ය අමාත්‍යතුමා 2020 වර්ෂයේ අගෝස්තු මස 14 වන දින රාජකාරී ආරම්භ කිරීම
    - නව රාජ්‍ය ලේකම්තුමා 2020 වර්ෂයේ අගෝස්තු මස 27 වන දින රාජකාරී ආරම්භ කිරීම යන විශේෂ වැඩසටහන් සංවිධානය කරන ලදි

13. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම

තොරතුරු දැනගැනීමේ පනතට අදාලව තොරතුරු ඉල්ලීම් දහයක් අදාල අංශ වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

## 2021 ඉදිරි දැක්ම

අමාත්‍යංශයේ කාර්යයන් පහසු කිරීම හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ කටයුතු පුළුල් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරියාගේ සහභාගීත්වයෙන් මාර්ග ගත දත්ත පද්ධති දැනට සකස් කර ඇති අතර මහජන දත්ත කලමනාකරණ පද්ධති, තැපැල් තොරතුරු කලමනාකරණ දත්ත පද්ධති, ලිපි ගොනු කලමනාකරණ පද්ධති සහ ලේඛනාගාර දත්ත කලමනාකරණ පද්ධති ලෙස මෘදුකාංග දත්ත පද්ධති කීපයක වැඩ මේ වන විට ආරම්භ කර ඇත.

2021 වර්ෂයේ අමාත්‍යංශයේ මනා වැඩ පරිසරයක් ඇතිකිරීම සඳහා අභ්‍යන්තර කාර්යාලීය සැලැස්මක් සකස්කර ඒ අනුව දැනට පවතින කාර්යාලීය සැලැස්ම වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය.

## 2.2 - සැලසුම් අංශය

### 2020 ප්‍රගතිය

#### ❖ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2020 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතන වලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදි.

❖ **ප්‍රගති සමාලෝචන රැස්වීම්.**

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණයට හා ඇගයීම සඳහා විෂයභාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික නිවාස වැඩසටහන පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් නිවාස හා ඉදිකිරීම් අංශය අනුව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් බැගින් සංවිධානය කර තිබුණද කොවිඩ් 19 තත්වය හමුවේ ඉන් බොහොමයක් පැවැත්වීමට නොහැකි විය.

❖ **ප්‍රගති වාර්තා සම්බන්ධීකරණය.**

මෙම අමාත්‍යාංශය අයිති කැබිනට් අමාත්‍යාංශය වන නාගරික සංවර්ධන, නිවාස හා ජල කළමණාකරණ අමාත්‍යාංශය වෙත මාසිකව ද ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තුමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද ප්‍රගති වාර්තා 04 ක් ද ලබා දීම සිදු කරන ලදී.

❖ **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබාගැනීම.**

2020 වර්ෂය අවසාන වන විට මෙම අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 5 ක් පවතී. එම සියළුම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ ඉන්දියානු රජය විසිනි.

2018 ජුලි 26 දින ඉදිකිරීම් ආරම්භ කළ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතිය ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතාවයන් මත නිසි කලට අවසන් කිරීමට නොහැකි විය. 2020 වර්ෂ අවසානයට එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු.මි.47 ක් සහ භෞතික ප්‍රගතිය 30% වශයෙන් සටහන් විය. ඒ අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කොට වෙනත් සුදුසු කොන්ත්‍රාත්කරුවකුට ඉදිකිරීම් කාර්යයන් පවරන ලෙස ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය වෙත නිර්දේශ ලබාදෙන ලදි. ඉන්දියානු රජය විසින් ලබාදුන් ඉහත සියළුම ව්‍යාපෘති එකක් රු.මි.300 බැගින් වටිනාකමකින් යුක්ත වේ.

## 2021 ඉදිරි දැක්ම

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්ට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 12 ක්, භාණ්ඩාගාර අරමුදල් ලබාගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකි විය. එම නව ව්‍යාපෘති යෝජනා මගින් ඉල්ලා සිටින මුදල රු.මි.2180 කි.

# 2.3 - නිවාස හා සංවර්ධන අංශය

## 2.3.1 නිවාස අංශය

### 2020 ප්‍රගතිය

❖ **‘‘ඔබට ගෙයක් - රටට හෙටක් ‘‘ නිවාස වැඩසටහන**

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම සුවපහසු නිවහනක ජීවත් වීමට ඉඩ සලසා දීම තුළින් එළදායි පුද්ගලයින් හා සතුටින් ජීවත් වන පවුලක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් ‘‘ඔබට ගෙයක් රටට හෙටක් ” නිවාස වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මෙම වැඩසටහනෙහි පළමු අදියර යටතේ සෑම ග්‍රාම නිළධාරී වසමකටම තාවකාලික නිවසක පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් බැගින් ප්‍රමුඛතාවය අනුව තෝරාගෙන, තෝරාගත් සෑම ප්‍රතිලාභී පවුලක් සඳහාම රු. ලක්ෂ 6 ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ඉදිකිරීම් ප්‍රගතිය මත පදනම්ව අදියර 5 කින් ලබා දීම සිදු කෙරිනි.

‘‘ ඔබට ගෙයක් - රටට හෙටක් ” නිවාස වැඩසටහනෙහි සමස්ථ ඉලක්කය නිවාස ඒකක 14,022 කි. 2020 වර්ෂය තුල නිවාස 9,972 ක ඉදිකිරීම ආරම්භ වූ අතර නිවාස 4,027 ක ඉදිකිරීම් අවසන් කෙරිනි. මෙම වැඩසටහන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා දීප ව්‍යාප්ත ක්‍රියාත්මක කරනු ඇත.

### ❖ නිවාස ව්‍යාපෘති හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන්

2020 වර්ෂය තුල නිවාස විෂයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම හා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. (2020 වර්ෂය තුල අමාත්‍ය මණ්ඩල සංදේශ/ සටහන් 06 ක් ඉදිරිපත් කර ඇත)

### ❖ ලෝක ජනාවාස දිනය - 2020

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්, 1985 වසරේ වාර්ෂික සැසිවාරයේදී ඉදිරිපත් කෙරුණු යෝජනාවකට අනුව 1986 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය (World Habitat Day) වශයෙන් ප්‍රකාශයට පත්කොට තිබේ. ඒ අනුව පසුගිය වසර 33 ක කාලය තුළ නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාළ විවිධ වූ තේමාවන් යටතේ ලෝක ජනාවාස දින සැමරුම සිදුකරනු ලැබීය.

ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ (UN-Habitat) ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනය වන්නේ නිවාස විෂයභාර අමාත්‍යාංශයයි.
ඒ අනුව ලෝක ජනාවාස දිනය එක් දිනකට, සතියකට හෝ මසකට පමණක් සීමා නොකර, "සැමට සුවපහසු නිවසක් - සතුට සපිරි නගරයක් " "Housing for All : A Better Urban Future" යන තේමාව යථාර්තයක් කිරීම හා සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල ජනතාව වෙත ලබා දීම සඳහා මෙම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන විසින් කටයුතු සිදු කරනු ලැබීය.
මේ සඳහා සංවර්ධන වැඩසටහන්, ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්, ළමා වැඩසටහන්, ව්‍යවසායක ප්‍රවර්ධන වැඩසටහන් ආදී වැඩසටහන් සිදුකරනු ලැබීය. ඒ අතරින් සිදුකරන ලද සමහර වැඩසටහන් පහත පරිදි වේ.

- ඔබට ගෙයක් රටට හෙටක් වැඩසටහන යටතේ වැඩ අවසන් නිවාස ඇතුළු අනෙකුත් ඉදිකරන ලද නිවාස ජනතා අයිතියට පත් කිරීම, / හඳුනාගත් නව නිවාස ආරම්භ කිරීම (දිවයින පුරා)
- ලෝක ජනාවාස දින තේමාව අනුව ළමා වැඩසටහන් ( දිවයිනම ආවරණය වන පරිදි චිත්‍ර තරඟයක්) පැවැත්වීම
- නාගරික අඩු ආදායම් ලාභීන් සඳහා ව්‍යවසාය ප්‍රවර්ධන වැඩසටහන් සිදුකිරීම - වීදි ආහාර, අත්කම්, ඇඟළුම් හා වෙනත් නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් (මුළු දිවයිනම ආවරණය වන පරිදි)
- නාගරික අඩු පහසුකම් ජනතාව සඳහා ප්‍රජා නායක වැඩමුළුවක් පැවැත්වීම (ප්‍රජා නායකයන් ඇගයීම හා දිරිගැන්වීම)
- දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශන හා වැඩමුළු, උපදේශන වැඩසටහන්, ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්
- ගම්පහ අත්තනගල්ල රණ්පොකුණුගම පිහිටි ගුරු ගම්මාන ව්‍යාපෘතියෙහි විදුලිය ලබාදීමට හා අභ්‍යන්තර මාර්ග පිලිසකර කිරීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීම.

ලෝක ජනාවාස දින ජාතික උත්සවය 2020.10.05 දින අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර තිබියදී, කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2020.10.04 දින ජාතික උත්සවය අවලංගු කරන ලදී.

2021 ලෝක ජනාවාස දිනය 2021.10.04 දිනට යෙදෙන අතර ඒ සදහා අදාල ආයතන සහභාගිත්වයෙන් ඉදිරියේ වැඩසටහන් සැලසුම් කරනු ඇත.

### ❖ නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම

2020 වර්ෂය සඳහා ගරු අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන පාර්ලිමේන්තු ප්‍රශ්න 09 කට පිළිතුරු සකස් කර ඉදිරිපත් කර ඇත. අදාළ පිළිතුරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඇතුළු අදාළ ආයතන සම්බන්ධ කරගනිමින් සකස් කර ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්නය සඳහා පිළිතුරු සකස් කර ඇත.

- **මහජන ඉල්ලීම්**

ජනාධිපති කාර්යාලයෙන්, අග්‍රාමාත්‍ය කාර්යාලයෙන්, වෙනත් ආයතන වලින් සහ සෘජුව මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන සියළු මහජන ඉල්ලීම් අදාල ආයතන වෙත යොමු කිරීම හා ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2020 වර්ෂය සඳහා සියළු මහජන ඉල්ලීම් 4890ක් ලැබී ඇති අතර එවා අදාල ආයතන වෙත යොමුකර ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

- **1972 අංක 07 දරණ ගෙවල් කුලී පනත සංශෝධනය කිරීම**

2018 අයවැය යෝජනාවට අනුව කුළී නිවාස වෙළඳපොළේ නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීමට නව නෛතික යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම පිණිස නව නීති කෙටුම්පතක් සම්පාදනය කිරීමට විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව අදාල නිලධාරින්, පර්ශවකරුවන් හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ලබාදුන් අදහස් අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධනය කරන ලද නව පනත් කෙටුම්පත මේ වන විට මෙම අමාත්‍යාංශය යොමු කර ඇති අතර මේ සම්බන්ධ අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

- **මධ්‍යම පාන්තික නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය**

මැදි ආදායම්ලාභී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා මහල් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය දිවයින පුරා ප්‍රධාන නගර, අධිවේගී මාර්ග වල පිවිසුම් දොරටු, ප්‍රධාන මාර්ග හා දුම්රිය ස්ථාන වලට ආසන්න උප නගර කේන්ද්‍රකොට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු මධ්‍යම ආදායම්ලාභීන්ට සියලු පහසුකම් වලින් සපිරි මහල් නිවසක් සහනාදායී ණය පහසුකම් සමඟ ලබාදීමට අපේක්ෂිතය.

මේ සඳහා ඉඩම් රජය මඟින් ලබාදෙන අතර, යටිතල පහසුකම් නිවාස ව්‍යාපෘතිය දක්වා ලබාදීම එම සේවා සපයන රේඛීය අමාත්‍යාංශය හා ආයතන මඟින් සිදු කරයි. මෙම නිවාස වැඩසටහන තුල නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම හා අලෙවිය අදාල නිවාස ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආයෝජනය සිදු කරන ආයෝජකයාගේ කාර්ය භාරය වන අතර, අධීක්ෂණය ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලබයි. ඉදිකිරීම් ආරම්භ කරන ලද සෑම නිවාස ව්‍යාපෘතියකින්ම ඉදිකරන නිවාස ඒකක සංඛ්‍යාවෙන් 80% ක් මධ්‍ය ආදාම්ලාභීන් සඳහා වෙන් කෙරෙන අතර, (මේ වන විට ඉදිකිරීම් සිදුකර ඇති නිවාස ව්‍යාපෘතීන්හි නිවාස රුපියල් මිලියන 5 ක මුදලට ප්‍රතිලාභීන්ට ලබාදී ඇත) ඉතිරි 20% නිවාස ප්‍රමාණය වෙළෙඳපොල අවශ්‍යතාවය මත අලෙවි කිරීමට ආයෝජකයාට ඉඩ අවස්ථාව ලබාදී ඇත.

මෙම වැඩසටහන යටතේ මේ වන විට නිවාස ව්‍යාපෘති 4 ක ඉදිකිරීම් ආරම්භ කර ඉන් ව්‍යාපෘති 2ක් ජනතා අයිතියට පත් කර ඇත.

මේ වන විට ජනතා අයිතියට පත් කරන ලද නිවාස වැඩසටහන්

ග්‍රීන් වැලි නිවාස ව්‍යාපෘතිය - අතුරුගිරිය (නිවාස 352)

මවුන්ට් ක්ලිෆර්ඩ් ව්‍යාපෘතිය (අදියර 1) - හෝමාගම (නිවාස 688)

[ මවුන්ට් ක්ලිෆර්ඩ් ව්‍යාපෘතිය 2021 ජුලි මස අවසන් කිරීමට නියමිතය ] - අදියර 2 (නිවාස 142)

මේ වන විට ඉදිකිරීම් සිදුකරන නිවාස ව්‍යාපෘති,

සී බ්‍රීස් නිවාස ව්‍යාපෘතිය- වාද්දුව (නිවාස 196)

ලාවන්‍යා හයිට්ස් ව්‍යාපෘතිය- රාගම (නිවාස 134)

ඉදිරියේදී ආරම්භ කිරීමට යෝජිත නිවාස වැඩසටහන්,

ඉස්කාගාරවත්ත - කුණ්ඩසාලේ (නිවාස 330), ඩෙන්වර්වත්ත - මාවතගම (නිවාස 500), ඇලිස්ටන්වත්ත - බේරුවල (නිවාස 150), මොහොප්පුගේ වත්ත - බේරුවල (නිවාස 150), ගම් උදා ඉඩම - හිඟුරක්ගොඩ (නිවාස 150), ලංකාලෝහ ඉඩම - යක්කල (නිවාස 340), රටලංකා වත්ත - කඹුරුපිටිය (නිවාස 300), සොයිසාවත්ත - ඉංගිරිය (නිවාස 150), ගල්ලෑල්ල - පොලොන්නරුව (නිවාස 100), මඟුරුඔයවත්ත ඉඩම - කුරුණෑගල (නිවාස 400)

## 2021 ඉදිරි දැක්ම

❖ **සෑම මැතිවරණ කොට්ඨාශයකම මැදි ආදායම්ලාභී නිවාස 100ක් (මහල් නිවාස) ඉදිකිරීමේ ව්‍යාපෘතිය - "සියපත නිවාස වැඩසටහන"**

අතිගරු ජනාධිපතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සෑම පවුලකටම සුවපහසු නිවසක් ලබා දීමේ වැඩපිළිවෙල යටතේ මධ්‍යම පාන්තිකයන්ගේ ආදායමට ගැලපෙන මහල් නිවාස පහසු මිලට ලබා දීමට කටයුතු කෙරේ.

ඒ අනුව, නිවාස නොමැති හා දීර්ඝ කාලීනව නාගරික ප්‍රදේශ ආශ්‍රිතව වාසය කිරීමේ අවශ්‍යතාවය ඇති මැදි ආදායම්ලාභී පවුල් සඳහා නිවාස සැපයීමේ අරමුණ පෙරදැරිව සෑම මැතිවරණ කොට්ඨාශයකම මැදි ආදායම්ලාභීන් ඉලක්ක කරගත් නිවාස 100ක මහල් නිවාස ඒකකයක් බැගින් දිවයින පුරා මැතිවරණ කොට්ඨාශ 160හි නිවාස 16,000ක් ඉදිකිරීමට අපේක්ෂිතය.

මෙම වැඩසටහන යටතේ නිවසක් නොමැති හෝ කුලී/බදු පදනම මත අදාල ප්‍රදේශයේ ස්ථිරව පදිංචි මධ්‍යම පාන්තික පවුල් ඉලක්ක කර ගනිමින් ප්‍රාදේශීය ඉල්ලුම අනුව නගර ආශ්‍රිතව මහල් නිවාස හෝ පොකුරු නිවාස ඉදිකිරීමට අපේක්ෂිතය.

මධ්‍යම පාන්තිකයින් සඳහා ඉදිකෙරෙන නිවාස රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර ඊට සමගාමීව ප්‍රතිලාභීන් සඳහා දීර්ඝ කාලීනව ගෙවිය හැකි වනසේ රාජ්‍ය බැංකු මැදිහත් කරගනිමින් ණය වැඩසටහනක්ද ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මෙම කාර්යය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හෝ ඒ සඳහා ලබාගත හැකි උචිත රජයේ ඉඩම් භාවිතා කිරීමට අපේක්ෂිත බැවින් ඉඩම් සඳහා අතිරේක වැයබරක් දැරීමට සිදු නොවේ.

මෙහි මූලික අදියර ලෙස පළාත් 9යෙහි මහල් නිවාස ව්‍යාපෘති 9ක් ඉදිකිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතියි.

❖ **මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය**

බුද්ධ ශාසනය සඳහා දරුවන් පිදූ, ආර්ථික වශයෙන් දුෂ්කර මට්ටමක සිටින නිවසක් අහිමි හෝ අඩක් සාදන ලද නිවෙස් හිමි දෙමව්පියන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා " මිහිඳු නිවහන" නිවාස ආධාර වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන වඩාත් සාර්ථකව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා " මිහිඳු නිවහන" මෙහෙයුම් කමිටුව පත්කර ඇත.

මෙම වැඩසටහන සඳහා ලැබී ඇති ඉල්ලුම අනුව මෙහි මූලික අදියර ලෙස 2021 වසර සිට උපරිම ලෙස නව හා වැඩිදියුණු නිවාස 2000ක් ඉදිකිරීමට අපේක්ෂිතය. එහිදී සිය දරුවන් බුදු සසුනෙහි පැවිදි කරවන ලද දෙමව්පියන් වැඩි වශයෙන් ජීවත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබාදීමට කටයුතු කෙරෙනු ඇත.

"මිහිඳු නිවහන" නිවාස වැඩසටහන, මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක" ඔබට ගෙයක් - හෙටක් " නිවාස වැඩසටහනෙහි උප වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ඒ අනුව මේ යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන්ට නව නිවසක් ඉදිකිරීම සඳහා මුදලින් රු. 600,000.00 ක ආධාරයක් ලබාදීමටත්, අඩක් සාදා නිම කරන ලද නිවසක් සම්පූර්ණ කිරීම සඳහා රු. 600,000.00 ක උපරිමයක් දක්වා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශ කරනු ලබන මුදල ආධාරයක් ලෙස ලබාදීමටත් යෝජිතය. (මීට අමතරව අදාළ විහාරස්ථානයන් හැකි අයුරින් දායකත්ව මුදලක් ලබාදීම සිදුකල හැකිය)

### 2.3.2 ඉඩම් අංශය

2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන යටතේ අනුව ඔප්පු ලබා දීම සඳහා සභාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචි කළ යුතුව ඇති නිවාස යෝජනා ක්‍රමවලින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවට ලක් කර යෝග්‍යතා සහතිකයක් නිකුත් කළ පසු සභාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචි කළ හැකිය. ඒ අනුව පසුගිය වසර තුළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවට ලක් කළ නිවාස ඒකක ගණන 923 කි.

- ❖ ඉඩම් සම්බන්ධයෙන් මතුවූ ගැටළු නිරාකරණය සඳහා ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් 80ක් අදාල අංශ වෙත යොමු කිරීම.
- ❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ 01.**
  නුවරඑළිය ඔලිෆන්ට් වතුයායේ ස්ක්‍රබ් වත්ත ii කොටසින් පහළ හා මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමය සඳහා අක්කර 5ක භුක්තිය ජාතික නිවාස සංවර්ධන අධිකාරියට භාරදීමේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය
- ❖ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම්වල ලේඛණයක් පවත්වාගෙන යාම.
- ❖ ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ දෙපාර්තමේන්තු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම - ඉල්ලීම් 27ක්
- ❖ සියපත නිවාස යෝජනා ක්‍රමය සඳහා ඉඩම් හඳුනා ගැනීම.(දිස්ත්‍රික්ක 15ක් හා ඉඩම් 60ක් පමණ)
- ❖ 2020 වසරේ දිස්ත්‍රික්ක 25 සඳහා ඔප්පු 1004 ක් නිකුත් කර ඇත.

### 2.3.3 - ජාතික නිවාස කොමසාරිස් අංශය
### 2020 ප්‍රගතිය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ජාතික නිවාස කොමසාරිස් අංශය 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ පැවරී ඇති බලතල හා වගකීම් පරිදි,

- කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීම.
- ජාතික නිවාස කොමසාරිස්වරයා පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
- පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති දේපල සම්බන්ධයෙන් වරින්වර පැන නැගෙන ගැටළු නිරාකරණය කිරීම යන අරමුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

2020.01.01 දින සිට 2020.03.01 දක්වා කාළපරිච්ඡේදය තුළ ජාතික නිවාස කොමසාරිස් තනතුර පුරප්පාඩුව පැවති බැවින්ද, 2020.03.16 දින සිට කොවිඩ් 19 රෝගය නිසා රට තුල පැවති වාතාවරණය මත ද ජාතික නිවාස කොමසාරිස් අංශයේ කටයුතු අඩපණ වු බැවින් ක්ෂේත්‍ර පරීක්ෂණ සහ හිමිකම් සනාථ කිරීමට අදාලව පරීක්ෂණ නොපවත්වන ලදී.

එබැවින් 2020.01.01 සිට 2020.12.31 දක්වා කාලය තුළ කාර්යාලයට පැමිණි මහජනතාවගේ ගැටළු සහ ලිඛිතව ඉදිරිපත් වු ගැටළු සඳහා විසඳුම් ලබා දිම සිදු කරන ලද අතර 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ සින්නක්කර ඔප්පු 01 ක් නිකුත්කර ඇත. එමෙන්ම ජාතික නිවාස කොමසාරිස් අංශයට 2020 වර්ෂය තුල රජකාරීමය ලිපි 544 ක් ලැබී ඇති අතර විවිධ ගැටළු සම්බන්ධව මහජනයා 139 දෙනෙකු ජාතික නිවාස කොමසාරිස් හමුවට පැමිණ ඇත. එසේම පිඹුරු පිටපත් 33 ක් නිකුත්කර ඇත. තවද නඩු කටයුතු වෙනුවෙන් විවිධ අධිකරණ ඉදිරියේ සාක්ෂි පිණිස පෙනී සිටිමද , අධිකරණ කටයුතු සඳහා ලේඛන සකස් කිරීම ද, නීතිපති වරයා සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාල කටයුතු ඉටුකිරීම ද, 1972 අංක 07 දරන ගෙවල් කුලී පනත සංශෝධනය කිරීමේ කටයුතුවලට සම්බන්ධවීම ද සිදුකර ඇත.

## 2021 ඉදිරි දැක්ම

❖ දැනට පුරප්පඩුව පවතින 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ නිවාස දේපල උපරිම සමාලෝචන මණ්ඩලය සහ තක්සේරු මණ්ඩලය පත් කිරීම තුලින් ප්‍රමාද වී පවතින ඔප්පු ලබා දිමේ කටයුතු කඩිනම් කිරිම.

❖ ජාතික නිවාස කොමසාරිස්වරයාට පැවරී ඇති සභාධිපත්‍ය දේපළ සම්බන්ධව ඇති ගැටළු 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට අනුව විසදිම තුලින් ඒවායේ පදිංචි කරුවන්ට ඔප්පු ලබා දීමට අදාල කටයුතු සිදු කිරීම.

❖ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත පැවරී ඇති එහෙත්, මෙතෙක් හදුනා නොගත් නිවාස දේපල හදුනා ගැනිමට කටයුතු කිරිම සහ අදාල තොරතුරු ලේඛන ගත කිරීම.

❖ ස්ථානීය පරීක්ෂණ සහ කාර්යාලීය පරීක්ෂණ පවත්වා නිවාස වල පදිංචි කරුවන්ගේ/කුලී නිවැසියන්ගේ ගැටළු සඳහා විසදුම් ලබා දීම.

❖ කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දිම.

❖ නඩු කටයුතු සඳහා අධිකරණ තුල සාක්ෂි පිණිස පෙනී සිටිම, නීතිපති දෙපාර්තමේන්තුවේ නීති උපදෙස් සඳහා සාකච්ඡාවලට සහභාගිවිම, නීතිපතිවරයා සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාලවන කටයුතු ඉටුකිරිමට නියමිතය.

# 2.4 - තාක්ෂණ අංශය

## 2020 ප්‍රගතිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග 15 ක් සහ රීති 09 ක් අනුමත කල යුතුව ඇත. එමගින් නියෝග 13 ක් පාර්ලිමේන්තුව මඟින් අනුමත කර ඇත. ඊට අමතරව තවත් නියෝග 02 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. අමතරව රීති 06 ක් මේ වන විට ගැසට් කර ඇති අතර තවත් රීති 03 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

එමෙන්ම අමාත්‍යාංශයට අයත් සුවිශේෂී ප්‍රමුඛතාවක් වන ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම ප්‍රමාද වීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් අන්තර්ජාලය ඔස්සේ සියලු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන කටයුතු සම්බන්ධීකරණය ද සිදු කෙරේ.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පී හිඟයට පිළියමක් ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නිපුණතා පාදක ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් (National Building Code) පිළියෙල කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් පවතී.

Doing Business Index දර්ශකයේ ශ්‍රී ලංකාව පිහිටි ස්ථානය තව දුරටත් පහළ අගයකට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධීකරණයද මෙම අංශය මගින් සිදුකෙරේ.

එමෙන්ම ජාතික ඉදිකිරීම් උපදේශන සභාව මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත හා ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සංශෝධනය සඳහා අමාත්‍යාංශ යෝජනා ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

මීට අමතරව, ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල දත්ත ගබඩාවක් (Cost data base) සකස් කිරීම සඳහා නියාමන කමිටුවක් (Steering Committee) පත්කර ඉදිරි කටයුතු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සහය සහිතව ඉටු කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

එමෙන්ම, ඉතා උස් ගොඩනැගිලි සඳහා ප්‍රතිපත්තියක් (Policy on High rise Building ) සකස් කිරීම පිළිබඳ කටයුතු සිදු කරමින් පවතී.

ඉදිකිරීම් කර්මාන්තයේදී අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවතින බලපත්‍ර ලබාදිය යුතු ක්‍රමවේදය සරල කිරීමට කටයුතු කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වන අතර, ඒ පිළිබඳ තත්ත්වය නිරන්තරයෙන් සාකච්ඡාවට ලක්කිරීම සිදුවේ.

ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනය කිරීමේදී විශේෂ කාර්යභාරයක් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් ඉටුවේ. ඒ අනුව, විශේෂ වානේ හා දැව වැඩ නිෂ්පාදන හා අළුත්වැඩියා කටයුතු මෙන්ම වාරිමාර්ග, සෞඛ්‍ය, අධිකරණ, ප්‍රවාහන, තැපැල් හා අනෙකුත් අංශ සේවාවන්හි පිළිසකර කිරීම් හෝ වැඩි දියුණු කිරීම් සම්බන්ධ රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත් සෘජුව සාකච්ඡා පදනමින් ඉටු කරනු ලබයි.

එමෙන්ම, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත, යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, සේවා සහ උපදේශන සැපයීම, තාක්ෂණික හා ඉංජිනේරු ආධුනිකයන්, වෘත්තීය ඉංජිනේරුවන් වෙත යාන්ත්‍රික වැඩ හා සේවා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීමද සිදු කරනු ලබයි.

අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාල මිලගණන් ඇගයීම අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව (STC) විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2020.12.31 දිනට ව්‍යාපෘති 186 ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා කමිටුවේ සුපරීක්ෂණය යටතේ අනුමැතිය ලබා දී ඇත.

ව්‍යාපෘති කොන්ත්‍රාත් කාර්යයන් 05 කට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු (MPC) විසින් අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 05 කි. දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ඉංජිනේරු සේවා අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සඳහා අදාල වන ව්‍යාපෘති 01 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

## 2021 ඉදිරි දැක්ම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ රීති 06 ක් මේ වන විට ගැසට් කර ඇති අතර තවත් රීති හා නියෝග 05 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම ප්‍රමාද වීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් අන්තර්ජාලය ඔස්සේ සියලු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන කටයුතු සම්බන්ධීකරණය කටයුතු 2021 වර්ෂයේදී ද සිදු කිරීමට නියමිතය.

ඵලදායි හා කාර්යක්ෂමභාවයට අදාලව ඉදිකිරීම් කර්මාන්තයක් සඳහා ඉදිකිරීම් ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රාමුව/ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම. මේ වන විට ආයතන කිපයකින් අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වා එවා ඇත.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පී හිඟයට පිළියමක් ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නිපුණතා පාදක ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය මෙම අංශය මගින් ඉටු කරනු ලබයි. (දිවයින පුරා දිස්ත්‍රික්ක රාශියකින් පුහුණුව අවශ්‍ය පුද්ගලයින්ගේ නාම ලේඛන මේ වන විට ද ලැබෙමින් පවති)

ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් (National Building Code) පිළියෙල කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් පවතී.

Doing Business Index දර්ශකයේ ශ්‍රී ලංකාව පිහිටි ස්ථානය තව දුරටත් පහළ අගයකට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධීකරණයද මෙම අංශය 2021 වර්ෂයේදී ද සිදුකෙරේ.

එමෙන්ම ජාතික ඉදිකිරීම් උපදේශන සභාව මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත හා ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සංශෝධනය සඳහා අමාත්‍යාංශ යෝජනා ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

මීට අමතරව, ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල දත්ත ගබඩාවක් (Cost data base) සකස් කිරීම සඳහා නියාමන කමිටුවක් (Steering Committee) පත්කර ඉදිරි කටයුතු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සහය සහිතව ඉටු කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර මේ වන විට නව ආයතන මගින් නියෝජිතයන් පත් කර එවා ඇත.

එමෙන්ම, ඉතා උස් ගොඩනැගිලි සඳහා ප්‍රතිපත්තියක් (Policy on High rise Building ) සකස් කිරීම පිළිබඳ කටයුතු සිදු කරමින් පවතී.

සපිරි යන්ත්‍ර නියාමක පුහුණු වැඩසටහන 2021 වර්ෂයේදී ද නියාමනය කිරීමට සැලසුම් කර ඇත.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් 2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සිදු කිරීමට සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන්,

- බස් බොඩි අළුත්වැඩියා කිරීම
- 2020 වර්ෂයේදී නිම කළ වාරිමාර්ග ව්‍යාපෘති වල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
- වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ජල පාලන දොරටු නිෂ්පාදන කාර්යයන්.
- වනජීවී දෙපාර්තමේන්තුව සතු යාල ජාතික වනෝද්‍යානය තුල පිහිටා ඇති වානේ පාලමක් අළුත්වැඩියා කිරීම.
- තැපැල් දෙපාර්තමේන්තුව සඳහා වානේ සැකිලි සහිත ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ස්ථාපනය කිරීම.
- දුම්රිය දෙපාර්තමේන්තුවේ මගී දුම්රිය මැදිරි අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් වැඩසටහන් ඉටු කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, 2021 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 2.4.1 - ඉංජිනේරු සේවා අංශය

අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාල මිල ගණන් ඇගයීම අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව ( STC ) විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2020.12.31 දිනට ව්‍යාපෘති 186ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා කමිටුවේ සුපරීක්ෂණය යටතේ අනුමැතිය ලබා දී ඇත.

ව්‍යාපෘති කොන්ත්‍රාත් කාර්යයන් 05කට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (MPC) අනුගමනය කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 05කි. දැනට ක්‍රියාත්මක තත්වයේ පවත්නා ඉංජිනේරු සේවා අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC ) සඳහා අදාල වන ව්‍යාපෘති 01ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

## 2.5 - ඉදිකිරීම් අංශය

### 2020 ප්‍රගතිය

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ**

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ නගමු පුරවර පාලම් ව්‍යාපෘතියේ සේවාදායකයා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.ස.අ.) වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරිය (මා.ස.අ) ලෙස වෙනස් කිරීම සඳහා අනුමැතිය සහ රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ කි.මී 100,000ක විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ උක්ත පාලම් ව්‍යාපෘති සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මුදල් වෙන්කිරීම.

- කිරිඳි ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පැරණි ජල පිරියම් යන්ත්‍රාගාරයේ හදිසි වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතියේ සේවාදායකයා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.ස.අ.) වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (ජා.ජ.ජ.ම.) ලෙස වෙනස් කිරීම, සංශෝධිත සංධිස්ථාන ගෙවීම් සටහන (Milestone Payment Schedule) සඳහා අනුමැතිය ලබා ගැනීම සහ උක්ත ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත මුදල් වෙන්කිරීම.

- තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකරන ලද ශ්‍රීමත් නරේන්ද්‍ර මෝදි ආදර්ශ ගම්මානය දක්වා යෝජිත ජලය බෙදාහැරීමේ ප්‍රධාන නල මාර්ගය එළීමේ ව්‍යාපෘතියේ සේවාදායකයා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.ස.අ.) වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (ජා.ජ.ජ.ම.) ලෙස වෙනස් කිරීම සහ උක්ත ව්‍යාපෘති සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත මුදල් වෙන්කිරීම.

- සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව (ගො.ද්‍ර.ස) ශක්තිමත් කිරීම - ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීම, පාරිභෝගිකයන් මිලදී ගත් වැලි සඳහා වන ගෙවීම් වවුචරය ගමනාන්තය දක්වා ප්‍රවාහනය සඳහා ප්‍රවාහන බලපත්‍රයක් ලෙස භාවිතා කිරීමට අවසර ලබා දීම.

- යාපනය දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම.

- 2019.04.21 දින මීගමුව, කටුවපිටිය, ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ සිදුවූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ තෝරාගත් බැතිමතුන්14ක් සඳහා නිවාස පහසුකම් සැලසීම.

- මිල කැඳවීමකින් තොරව තනි මූලාශ්‍ර ප්‍රසම්පාදන ක්‍රමයක් මත රාජ්‍ය ආයතන සඳහා සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම.

- සී-සිටි ව්‍යාපෘතියේ ශේෂ වැඩ සම්පූර්ණ කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම.

### ❖ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මගින් ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශයෙහි ක්‍රීඩා අංශයේ හා අනුබද්ධිත ආයතනවල ප්‍රතිපාදන මත ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීම.

- ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනය මගින් පරිගණක තාක්ෂණ හා ඉංජිනේරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව පුහුණු අවස්ථා 1500 ක් උසස් පෙළ සමත් සිසුන් වෙත 2020 අධ්‍යන වර්ෂයේ සිට ප්‍රදානය කිරීම.

- පරිසර හා වනජීවී අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ලුණුගම්වෙහෙර ප්‍රදේශයෙහි අලි රැදවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම පිළිබඳ ඒකාබද්ධ කැබිනට් පත්‍රය.

### ❖ යොමු ගත අනෙකුත් කාර්යභාරයන්

- නුගගහපුර නිවාස ක්‍රමයේ පස් කණ්ඩිය ස්ථාවර කිරීම වෙනුවෙන් අමාත්‍යංශ මට්ටමින් මැදිහත් වීම.

- අවසාන බිල්පත් සහතික කිරීම සහ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රඳවාගෙන තිබෙන ගාල්ල පළාත්බද මාර්ග කාපට් ඇතිරීමේ ව්‍යාපෘතියේ සහතික කළ බිල්පත් සඳහා අරමුදල් වෙන්කරන ලෙස ඉල්ලා සිටීම වෙනුවෙන් අමාත්‍යංශ මට්ටමින් මැදිහත් වීම.

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වෙනත් අමාත්‍යංශ දෙපාර්තමේන්තු සඳහා ගෙවිය යුතු හිඟ මුදල් පියවීමට අවශ්‍ය පියවර ගැනීම.

- මරදගහමුල වී ගබඩා හා වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු කිරීම. වෙළඳ සංකීර්ණයේ වෙළඳ කුටි 115 හි ඉදිකිරීම් වල ඉතිරි වැඩ අවසන් කිරීම සහ එම වෙළඳ කුටි නඩත්තු කර පවත්වාගෙන යාම වෙනුවෙන් අමාත්‍යංශ මට්ටමින් මැදිහත් වීම.

- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 2019 යෝජනා අංක (44) යටතේ බස් නැවතුම්පල හා දුම්රිය ස්ථාන 16ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මගින් සිදු කිරීම ද අප අංශයේ සෘජු මග පෙන්වීම මගින් සිදු කල මහගු සංවර්ධන කාර්යයන් වේ.

- නගමු පුරවර පාලම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාංශය මගින් ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් (SCAPC) පත් කිරීම.
    - ➢ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි ඉල්ලීම මත අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපෘතියේ පැන නැගි ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2020.10.22 වන දින රැස්වීමක් පැවැත්වීම.
    - ➢ මාර්ග සංවර්ධන අධිකාරිය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන ආයතන අතර අවශ්‍ය මැදිහත් වීම් සිදු කිරීම.
    - ➢ මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු සඳහා TEC කමිටුවට අවශ්‍ය තොරතුරු ලබා දෙන මෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සඳහා ලිපි යොමු කිරීම.
    - ➢ ව්‍යාපෘතියේ වර්තමාන තත්වය පිළිබඳ විමසීම.
    - ➢ රාජ්‍ය සංවර්ධන හා නීති ගත සංස්ථාව වෙත ප්‍රමාද අයකිරීම් (delay damages) සඳහා ගෙවීමට අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම.

## 2021 ඉදිරි දැක්ම

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතන, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යන ආයතන සමග මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම.

ඒ තුලින් සෑම ආයතනයක්ම විධිමත් පරිදි ලාභ ලබන ආයතන ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමාත්‍යංශ දායකත්වය ලබා දීම.

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙහි වර්තමානයේ පවතින මූල්‍ය අර්බුදයට පිලියමක් ලෙස එහි ප්‍රධාන අංශයන් 4 වන ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් හා උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, උපදේශන අංශය සමග සාකච්ඡා කර කෙටිකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම.

- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙහි මූල්‍ය අර්බුදයට පිලියමක් ලෙස ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම.

- දැනට ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇති සියපත නිවාස ව්‍යාපෘතියෙහි පිරිවැය අඩු කිරීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ සමඟ සම්බන්ධවී සුදුසු තාක්ෂණික ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- දැනට පැහැදිලි ප්‍රගතියක් අත් කරගෙන ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙහි ඉදිරි ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම සහ අමාත්‍යංශ මට්ටමින් ඒ සඳහා අවශ්‍ය පූර්ණ සහය ලබා දීම.
- ඉහත කාර්යන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අවශ්‍ය වී නම් ඒ සඳහා කඩිනම් පියවර ගැනීම.
- අප ඉදිකිරීම් අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්ය භාරයන් ආවරණය හා ඉලක්ක පරිදි ඉටුවන ලෙස අංශයට අදාලව සුදුසු පියවරයන් ගැනීම.

## 2.6 - මූල්‍ය අංශය

### 2020 ප්‍රගතිය

2020 වර්ෂය සඳහා අයවැය ලේඛනය මගින් සලසා දී ඇති මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වලට අදාළ අක්මුදල් ලබාගෙන එම මුදල් උපරිම කාර්යක්ෂමතාවයකට පත් කිරීම සඳහා ආයතනයන් තුළ නිසිකලට බෙදාහරිමින් වාර්තා පවත්වාගෙන යාම හා මාසික, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නිසි වේලාවට ලබාදීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

2020 වර්ෂය සඳහා රු.මිලියන 9088 ක් හා 1434 පිළිවෙලින් මූලධන හා පුනරාවර්තන වියදම් වශයෙන් අයවැය වාර්තාවෙන් වෙන් කර තිබුණි. එම මූල්‍ය ප්‍රතිපාදන වලින් මූලධන සඳහා රු.මිලියන 5844 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 1396 ක්ද වැයකර ඇත.මෙහිදී මූලධන වියදම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රධාන වශයෙන් අඩු අදායම් ලාභින්ට නිවාස ඉදිකිරීම සඳහා වැය කර ඇත.

### 2021 ඉදිරි දැක්ම

අමාත්‍යංශ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වස් ඒ ඒ අංශ සමඟ මනා සම්බන්ධීකරණයන් පවත්වා ගනිමින් අමාත්‍යංශයට අවශ්‍ය වන සියළුම ද්‍රව්‍ය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම මගින් අමාත්‍යංශ ඉලක්ක වලට ළගාවීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම සිදු කෙරේ.
එමෙන්ම මනා මූල්‍ය පාලනයන් පවත්වාගෙන යාම සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීමද මූල්‍ය අංශය මගින් සිදු කෙරේ.

## 2.7 - අභ්‍යන්තර විගණන අංශය

### 2020 ප්‍රගතිය

2020 වර්ෂයේ විගණන වාර්තා 04 ක කටයුතු අවසන් කර ඇත. 2020.12.31 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 න් 02 ක් පවත්වා ඇත. අනුබද්ධිත ආයතනයහි විමර්ශන 03 ක් අවසන් කර ඇති අතර විමර්ශන 04 ක කටයුතු සිදු කරමින් පවතී.

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන 11ක අධීක්ෂණය හා පසු විපරම් කටයුතු පැවරී තිබු නමුත් දැනට රාජ්‍ය අමාත්‍යාංශයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව යන ආයතන 03ක කටයුතු අධීක්ෂණයෙන් ඉවත් කර ඇති අතර නැවත පදිංචි කිරීමේ අංශය අළුතින් අධීක්ෂණයට හා පසු විපරම්කිරීම සඳහා ඇතුලත් කර ඇත.

2020 මාර්තු මස කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතුවෙන් වාර්ෂික විගණන වැඩ සටහනේ සඳහන් පරීක්ෂාවන් යම් ප්‍රමාණයක් ඉටු කිරීමට නොහැකි විය.

### 2021 ඉදිරි දැක්ම

2020 වර්ෂයේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වුවත් 2021 වර්ෂයේදි විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටු කිරීමටත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් කාර්තුමය වශයෙන් පැවැත්වීමටද විගණන වැඩසටහනට ඇතුලත් කර ගෙන ඇත.

## 2.8- නැවත පදිංචි කිරීමේ අංශය


උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති ගැටුම්කාරී තත්වය හමුවේ අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අදාළ වැඩසටහන් වල වගකීම මේ වන විට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ඇත.

ඒ අනුව නැවත පදිංචි කරනු ලබන පවුල් වල සුබසාධනය, ඉඩම් අහිමි පවුල් වෙත වාසස්ථාන තනා ගැනීම සඳහා ඉඩම් ලබාදීම, ඉන්දියාවේ සිට පැමිණෙන විතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම මෙන්ම මෙතෙක් බිම්වෙඩි ඉවත් කිරීමට ඉතිරිව ඇති භූමි ප්‍රදේශයන්ගේ බිම්වෙඩි ඉවත් කරමින් භූමිය නිසැක කිරීමේ කටයුත්තද සිදු කරමින් සිටී.

උතුර හා නැගෙනහිර පළාත් වල දශක 03 කට අධික කාලයක් පුරා පැවතුන අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් තම මුල් ගම් බිම් අහිමිව අවතැන් වු ජනතාවගේ නැවත පදිංචි කිරීමේ කටයුතු වලට අදාළ 2020 වර්ෂයට නිර්දේශිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා නැවත පදිංචිය අපේක්ෂාවෙන් සහන මධ්‍යස්ථාන වල හා ඥාතී හිතමිත්‍රාදීන් සමග වෙසෙන ජනතාවගේ සුභ සාධන සේවා සැපයීම සඳහා නැවත පදිංචි කිරීමේ අංශය වෙත අදියර 04ක් යටතේ රුපියල් මිලියන 5679.6 ක ප්‍රතිපාදන ලැබිනි. ඒ අනුව 2020 වර්ෂයේදී ගැටුම් හේතුවෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශවල ජනතාවට හා පෙරලා පැමිණෙන සරණාගතයන් සඳහා නිවාස පහසුකම් ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් හා වෙනත් මූලික යටිතල පහසුකම් මෙන්ම ජීවනෝපාය පහසුකම් සැලසීම ඇතුළුව කල්පවත්නා විසඳුම් ලබාදීම සඳහා අමාත්‍යාංශය පුළුල් පරාසයක සංවර්ධන වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

මෙහිදී එක් එක් දිස්ත්‍රික්කය තුළ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අවතැන්වූ පවුල්වල අවශ්‍යතාවයන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන එම තොරතුරු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මග පෙන්වීම් යටතේ අවශ්‍ය ප්‍රතිලාභීන් දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගනු ලැබේ. මෙහිදී ගැටුම්කාරී වාතාවරණය යටතේ ආබාධිතවුවන් සිටින පවුල්, කාන්තා මූලික පවුල්, අඩු ආදායම්ලාභී පවුල්, පුනරුත්ථාපනය කර සමාජගත කරනු ලැබූ පුද්ගලයින් සහිත පවුල් හා සුභසාධන මධ්‍යස්ථානයන්හි රැදී සිටින පවුල් මෙන්ම නෑදෑ හිතමිතුරන් සමග සිටින පවුල් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදී ඇත. ඒ අනුව අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්ණායක වලට පදනම්ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සෘජු මැදිහත්වීම මත බිම් මට්ටමේ සිට සිදු කරනු ලැබේ. එසේ ලබා ගන්නා තොරතුරු අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් කරනු ලබන ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින්ද සනාථ කිරීමට කටයුතු කරනු ලැබේ. තවද එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යාංශ නිළධාරීන් විසින්ද යම් යම් අදියරයන් හිදි අධීක්ෂණය කරනු ලබන අතර, එහිදි හදුනා ගනු ලබන ගැටළු හෝ බාධාවන් වේ නම් ඒ සඳහා පිළියම් යෙදීමටද කටයුතු කරනු ලැබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් හතරක් යටතේ රු.මි. 5,679.60ක ප්‍රතිපාදන 2020 වසර සඳහා වෙන් වූ අතර ඉන් රු.මි. 3,223.50ක පිරිවැයක් දරා 56.75%ක ප්‍රගතියක් ලගාකර ගැනීමට හැකිවිය.



………………………………………………………………………

**ප්‍ර.ග.නි./ ග.නි./ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය**

# පරිච්ඡේදය 3

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

ජීසීජ් -එෆ්

**2020-12-31 දිනෙන් අවසන් වු කාලසීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

රු.

| | | | තතය | | |
|---|---|---|---|---|---|
| අයවැය (වර්තමාන වර්ෂය) | | සටහන | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ACA - 1 |
| - | ගෘහස්ථ භාණ්ඩ හා සේවා සඳහා බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම සඳහා බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම සහ වෙනත් අය | 4 | 16,532,285 | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **16,532,285** | - | |
| | | | | | |
| - | **ආදායම් නොවන රිසිට්පත්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 7,290,195,291 | 12,701,854,000 | ACA – 3 |
| | තැන්පතු | | 144,958,721 | 3,069,224 | ACA - 4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 13,920,566 | 12,755,070 | ACA - 5 |
| - | වෙනත් ලැබීම් | | 1,522,297 | 88,301,357 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **7,450,596,875** | **12,805,979,651** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ)=(අ)+(ආ)** | | **7,467,129,161** | **12,805,979,651** | |
| - | | | | | |
| | **අඩුකලා - වියදම** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | - | ACA – 2 (ii) |
| 104,233,000 | වේතන,වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ | 5 | 184,432,640 | 109,537,546 | |
| 962,667,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,005,778,394 | 780,320,035 | |
| 111,170,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුවීම් | 7 | 206,881,719 | 228,212,844 | |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **1,178,070,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **1,397,092,753** | **1,118,070,425** | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| 12,012 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 691,402 | 4,045,890 | |
| 20,789,000 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම | 11 | 462,117 | 168,454,677 | |
| 205,771,000 | ප්‍රාග්ධන මාරුවීම් | 12 | 1,130,338,155 | 11,127,573,249 | |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 296,000 | ධාරිතා ගොඩනැගීම | 14 | 567,000 | 903,033 | ACA – 2 (ii) |
| 51,100,000 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | 2,668,816,806 | 369,015,899 | |
| **277,968,012** | **මුළු ප්‍රාග්ධන වියදම් (ඉ)** | | **3,800,875,480** | **11,696,992,748** | |
| | | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **153,211,278** | **15,226,985** | |
| | **තැන්පතු ගෙවීම්** | | 144,958,721 | 2,822,542 | ACA-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 8,252,557 | 12,404,443 | ACA-5 |
| | **මුළු වියදම උ= (ඇ+ඉ+ඊ)** | | 5,351,179,510 | 12,830,290,158 | |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ=(ඇ-උ)** | | 2,115,949,650 | (24,310,507) | |

# 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

## 2020 දෙසැම්බර් 31 දිනට

| | සටහන | තත්‍ය වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය |
|---|---|---|---|
| | | 2020 | 2019 |
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ,පිරියත හා උපකරණ | **ඊසීඑෆ් -6** | 532,564,361 | 279,640,560 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඊසීඑෆ් -5/5(අ)** | 34,685,928 | 25,863,254 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඊසීඑෆ් -3** | | |
| - | | | |
| **මුළු වත්කම්** | | **567,250,289** | **305,503,814** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 34,439,246 | 25,616,572 |
| දේපළ,පිරියත හා උපකරණ සංචිතය | | 532,864,361 | 279,640,560 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඊසීඑෆ් - 5(ආ)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | **ඊසීඑෆ් -4** | **246,682** | **246,682** |
| අග්‍රිම ශේෂය | **ඊසීඑෆ් -3** | | |
| - | | | |
| **මුළු වගකීම්** | | 567,550,289 | 279,887,242 |

පිටු අංක ……05……… සිට ……….52…… දැක්වෙන ඉහත ඊසීඑෆ් 1 සිට ඊසීඑෆ් 6 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..53……… සිට ..66…… දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකග වන බවටත් මෙයින් සහතික කරමු.

| …………………… | …………………… | ……………………………………… |
|---|---|---|
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය) |
| නම : ඉංජි. කීර්ති රංජිත් අබේසිරිවර්ධන ලේකම් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 02 වන මහල, "සෙත්සිරිපාය" බත්තරමුල්ල. | නම : | නම : |
| තනතුර : | තනතුර: | දිනය: 2021.02.28 |
| දිනය : 2021.02.28 | දිනය : | ප්‍රධාන මූල්‍ය නිලධාරි ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල. |

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - සී

දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය |
| | රු | රු |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | |
| ගාස්තු, අධිභාර,දඩ මුදල් සහ බලපත්‍ර | - | |
| ලාභ | - | |
| ආදායම් නොවන ලැබීම් | - | |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | |
| අග්‍රිම ලැබීම් | 7,293,324,476 | 12,790,155,357 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුළු මුදල් ප්‍රවාහය(අ)** | **7,293,324,476** | **12,790,155,357** |
| **<u>අඩුකළා - මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,125,674,966 | 817,386,813 |
| සහනාධාර සහ මාරුකිරීම් | 29,154,268 | 5,312,844 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,869,105,165 | 375,682,281 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 500,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන මුදල් ප්‍රවාහය (ආ)** | **7,024,434,398** | **1,198,381,938** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)- (ආ)** | **268,890,077** | **11,591,773,419** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | | - |
| ලාභාංශ | | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - |
| උපණය අය කර ගැනීම | | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 948,553 | 1,291,203 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය ( ඈ)** | **948,553** | **1,291,20** |

| | | |
|---|---|---|
| **<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් | | |
| ආයෝජන අත්පත්කර ගැනීම් | 260,510,073 | 1,583,522,145 |
| අත්තිකාරම් ගෙවීම් | 5,097,338 | 9,542,477 |
| **ආයෝජන ක්‍රියාකාරම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)** | **265,607,411** | **11,593,064,622** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(264,658,858** | **(11,591,773,419)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)-(ඊ)** | **4,231,219** | |
| | - | |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | - |
| විදේශීය ණය ගැනීම් | | - |
| ප්‍රදානයන් ලැබීම් | | - |
| තැන්පතු ලැබීම් | 135,373,305 | 2,822,542 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **135,373,305** | **2,822,542** |
| **<u>අඩු කළා - මුදල් වැය කිරීම් :</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| - | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| - | | |
| තැන්පතු ගෙවීම් | 139,604,524 | 2,822,542 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)** | **139,604,524** | **2,822,542** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය(ඒ)=(ඌ)-(එ)** | **(4,231,219)** | |
| - | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **0** | 0 |
| - | | |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **0** | **0** |
| - | | |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | 0 | 0 |

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුවේ විස්තරය | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| | නැත | | | | |

## 3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,433,660 | 1,433,660 | 1,397,093 | 97% |
| ප්‍රාග්ධන | 4,284,602 | 4,284,602 | 3,800,875 | 88% |

3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අ. අ | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන ,ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පිරිසිදුකම පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය | 1. අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම | 4,000,000 | 4,000,000 | 3,534,724 | 88% |
| | | 2.අඩු ආදායම් ලාභී පවුල් සඳහා අර්ධ වශයෙන් ඉදිකළ නිවාස නිම කිරීම | 700,000 | 700,000 | 587,700 | 84% |
| | | 3.නිවාස යෝජනා ක්‍රමය අලුත්වැඩියා කිරීම | 10,000 | 10,000 | - | - |
| | | 4.එක්සත් ජාතීන්ගේ වාසස්ථානය | 2,000 | 2,000 | 2,000 | 100% |
| | | 5.මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය | 40,000 | 40,000 | 28,050 | 70% |
| | | 6.බස් පර්යන්ත සහ දුම්රිය ස්ථානයේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම | 48,000 | 48,000 | 19,396 | 40% |

**3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය 31.12.2020 | දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය 31.12.2020 | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 532,864,361 | 532,864,361 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | නැත | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 48 න් පසුව ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත.

# පරිච්ඡේදය 4
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම යටතේ ඔබට ගෙයක් රටට හෙටක් වැඩසටහන මගින් දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකම නව නිවසක් තැනීම යටතේ නිවාස 14022 ක් ඉදිකිරීමට සැලසුම් කලද 9972 ක ඉදිකිරීම් ආරම්භ කිරීමට හැකි විය. | | | ✓ |
| නව සහ අර්ධ වශයෙන් නිම කල නිවාස සඳහා ණය ආධාර ලබා දීම යටතේ රු.මි 1000ක ඉලක්කයක් යටතේ රු.මි.567 ක් දක්වා ලගා වී ඇත. | | | ✓ |
| ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් 1742 ක පුහුණුලාභීන් ප්‍රමාණයක් පුහුණු කිරීමට සැලසුම් කල අතර ඉන් 906 දෙනෙකු පුහුණු කර ඇත. | | | ✓ |

සැ.යු- අමාත්‍යාංශයට අනුබද්ධිත සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත දර්ශක ඒ ඒ ආයතනය විසින් වෙන වෙනම ඉදිරිපත් කරන කාර්ය සාධන වාර්තා වල ඉදිරිපත් කර ඇත.

# පරිච්ඡේදය 5
## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය /අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% -74% | 75% -100% |
| අමාත්‍යාංශය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම සකස් කොට අනුමැතියට ඉදිරිපත් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම | | | * සකස් කල සැලැස්ම සදහා තිරසර සංවර්ධන ජාතික සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණය හා අභියෝග සැකෙවින්

තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම අනුබද්ධයෙන් ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගන්නා විෂය ක්ෂේත්‍ර 6 ක්, ඉලක්ක 16 ක්, සහ උපායමාර්ග 110 ක් හඳුනාගෙන ඇත. නිවාස සහ ඉදිකිරීම් අංශ වලට අදාලව ව්‍යාපෘති හා වැඩසටහන්ද ඇතුලත්ව ක්‍රියාත්මක සැලැස්ම සම්පූර්ණ කර, නිරීක්ෂණ සහ උපදෙස් සඳහා තිරසර සංවර්ධන ජාතික සභාව වෙත ඉදිරිපත් කර ඇත. තිරසර සංවර්ධන ජාතික සභාවේ යෝජනා මේ වන විට ලැබී ඇති අතර ඒම යෝජනා අනුව අවශ්‍ය සංශෝධන සඳහා ආයතන වලට දන්වා යවා ඇත.

# පරිච්ඡේදය 6
# මානව සම්පත් පැතිකඩ

**06.1 කාර්ය මණ්ඩල පාලනය**

**නිවාස හා ඉදිකිරීම් අංශය**

| **මට්ටම** | **අනුමත සේවක සංඛ්‍යාව** | **දැනට සිටින සේවක සංඛ්‍යාව** | **සේවක සංඛ්‍යා හිගය/ අතිරික්තය** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 26 | 07 |
| තෘතීය මට්ටම | 06 | 02 | 04 |
| ද්විතියික මට්ටම | 106 | 78 | 28 |
| ප්‍රාථමික මට්ටම | 52 | 37 | 15 |
| **එකතුව** | **197** | **143** | **54** |

**නැවත පදිංචි කිරීමේ අංශය**

| **මට්ටම** | **අනුමත සේවක සංඛ්‍යාව** | **දැනට සිටින සේවක සංඛ්‍යාව** | **සේවක සංඛ්‍යා හිගය/ අතිරික්තය** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 09 | 07 |
| තෘතීය මට්ටම | 05 | 01 | 04 |
| ද්විතීයික මට්ටම | 97 | 92 | 05 |
| ප්‍රාථමික මට්ටම | 27 | 22 | 05 |
| **එකතුව** | **145** | **124** | **21** |

**06.2 නිවාස හා ඉදිකිරීම් අංශය**

මෙම අමාත්‍යාංශයේ දීප ව්‍යාප්ත සේවාවල ඇතැම් තනතුරු පුරප්පාඩු පැවති අතර ඒ සඳහා පූර්ණ කාලීනව රාජකාරි ඉටු කිරීමට සහ වැඩ බැලීමට නිලධාරීන් පත් කර තිබූ අතර එම තනතුරු ස්ථාවරව පිරවීමේ අවශ්‍යතාවය රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. එසේම ඇතැම් තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවලින් සේවක පිරිස් යොදවා ගනිමින් රාජකාරි කටයුතු දැනට ඉටු කරගෙන යනු ලැබේ.මෙම සියළු පුරප්පාඩු පිරවීම සඳහා අදාල ආයතන දැනුවත් කර ඇත. ඒ අනුව නැවත පදිංචි කිරීමේ අංශයේ ඇතුළුව පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව මෙසේ ඉදිරිපත් කරමි.

ඉදිකිරීම් විෂය සම්බන්ධ ප්‍රධාන අමාත්‍යාංශය වන මෙම අමාත්‍යාංශයේ ඉදිකිරීම් හා තාක්ෂණ අංශයේ අතිරේක ලේකම් තනතුරු දෙක සඳහා වැඩ බැලීමට නිලධාරීන් පත්කර ඇති අතර ඒ සඳහා ස්ථිර නිලධාරීන් පත් කිරීම අත්‍යාවශ්‍යය.

දීප ව්‍යාප්ත සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටම

| **සේවය** | **පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** |
|---|---|
| අතිරේක ලේකම් ශ්‍රී.ලං.පරි.සේවය | 01 |
| අතිරේක ලේකම් ශ්‍රී.ලං.ඉංජි.සේවය | 02 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී ශ්‍රී.ලං.ගණ.සේවය | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ලං.පරි.සේවය | 02 |
| සහකාර ලේකම් ශ්‍රී.ලං.පරි.සේවය | 02 |
| සහකාර අධ්‍යක්ෂ ශ්‍රී .ලං.පරි.සේවය | 02 |
| සහකාර අධ්‍යක්ෂ ශ්‍රී .ලං.ඉංජි.සේවය | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ලං.ගණ.සේවය | 01 |

තෘතීය මට්ටම

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|
| පරිපාලන නිලධාරී | 01 |
| භාෂා පරිවර්තක 1. සිංහල- ඉංග්‍රීසි<br>2. සිංහල-දෙමළ | 02<br>02 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 |

ද්විතියික මට්ටම

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|
| කළමනාකරණ සහකාර සේවය | 09 |
| සංවර්ධන නිලධාරී සේවය | 15 |

ප්‍රාථමික මට්ටම

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|
| කාර්යාල සේවක සේවය | 20 |
| රියදුරු | 09 |

## 06.3 මානව සම්පත් සංවර්ධනය සඳහා 2020 වර්ෂය සඳහා පැවති පුහුණු වැඩසටහන්

| වැඩසටහනේ නම සහ පවත්වන ලද ආයතනය | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉදිකිරීම් වලදී කොන්ක්‍රීට් හා වැසි ජලය පිළිබඳ සම්මන්ත්‍රණය (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය) | 2 | 7 පැය | 8,000.00 | | දේශීය | ඉදිකිරීම් සම්බන්ධව |
| ආයතනික නීති සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (අමාත්‍යාංශයේ පාලන අංශය) | 2 | 8 පැය | නොමිලේ | | දේශීය | ආයතන සංග්‍රහයේ විධිවිධාන රාජකාරී සඳහා යොදා ගැනීම |
| ලිපිගොනු කලමනාකරණ පුහුණු වැඩසටහන් (අමාත්‍යාංශයේ පාලන අංශය) | 58 | 3 1/2 පැය | 5,785.00 | | දේශීය | ලිපි ගොනු කලමනාකරණ දැනුම |
| අකුරු ටයිප් කිරීමේ පරිගණක භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් (අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය) | 20 | 2 පැය | 1, 155.00 (සංග්‍රහ වියදම්) | | දේශීය | පරිගණක භාවිතය පිළිබඳ දැනුම |
| අකුරු ටයිප් කිරීමේ පරිගණක භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් (අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය) | 23 | 3 පැය | 1, 440.00 (සංග්‍රහ වියදම්) | | දේශීය | පරිගණක භාවිතය පිළිබඳ දැනුම |
| බහු මහල් ගොඩනැගිලිවල ව්‍යුහාත්මක සැලසුම ( Society of Structural Engineers Sri Lanka) | 1 | 5 දවස් | 30,000.00 | | දේශීය | බහු මහල් ගොඩනැගිලිවල ව්‍යුහාත්මක සැලසුම පිළිබඳ දැනුම |
| ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම (අමාත්‍යාංශයේ සැලසුම් අංශය) | 20 | 3 1/2 පැය | නොමිලේ | | දේශීය | ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳ දැනුම |

# පරිච්ඡේදය 7
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම්** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබිම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරී පාලනය යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| **7**.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| | සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම | අනුකූල වේ | | |
| 10. 3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූලවීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල නොවේ | අදාළ නොවේ | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත තාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ජේදයට අනුව පුරවැසියන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | අනුකූල වේ | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම්කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ජේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ජේදවලට ප්‍රතිචාර දැක්වීම** | අනුකූල වේ | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |